2022.12.08 මහා සභා වාර්තාව

පාණදුර නගර සභාව

දිනය : 2022.12.08

වෙලාව : පෙ.ව. 10.00

ස්ථානය : නගර සභා රැස්වීම් ශාලාව

සහභාගී වීම:

ගරු සභාපති - එම්.ඩී.නන්දන ගුණතිලක මහතා

ගරු උපසභාපති - පී.එච්.විල්මන් මහතා

ගරු නාගරික මන්ත්‍රී - රජීව සංජය වීරමන් මහතා

ගරු නාගරික මන්ත්‍රී - අයි.ජානක උදයවර්ණ සොයිසා වික්‍රමසිංහ මහතා

ගරු නාගරික මන්ත්‍රී - විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී - එම්.පියසේන ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී - කේ.ඩී.අශෝකා රත්නමාලි මිය

ගරු නාගරික මන්ත්‍රී - කුමුදු ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී - කමල්සිරි ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී _ ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතා

ගරු නාගරික මන්ත්‍රී _ එච්.ඩී.මහින්ද පුන්සිරි මහතා

ගරු නාගරික මන්ත්‍රී _ පද්මා කොස්තා මිය

ගරු නාගරික මන්ත්‍රී _ පුෂ්පා ෆොන්සේකා මිය

ගරු නාගරික මන්ත්‍රී _ එච්.වන්දිම ඒ.පීරිස් මහතා

ගරු නාගරික මන්ත්‍රී _ ගයා උදයංගනී ද සිල්වා මිය

ගරු නාගරික මන්ත්‍රී _ ආර්.බන්දුල සොයිසා මහතා

ගරු නාගරික මන්ත්‍රී _ එම්.පද්මසිරි සිල්වා මහතා

ගරු නාගරික මන්ත්‍රී _ ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

ලේකම් _ ටී.මානෙල් සියඹලාගොඩ මෙය

සභාව පිළිගැනීම හා ආගම සිහි කිරීම

ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීමෙන් හා ආගම සිහිකිරීමෙන් පසුව මහා සභා රැස්වීමේ වැඩ කටයුතු පෙරවරු 10.00 ට ආරම්භ කරන ලදී.

(අ) පසුගිය සභාවේ රැස්වීම් වාර්තා සම්මත කිරීම -

(අ.1) 2022.11.03 මහා සභා වාර්තාව

2022.11.03 වන දින මහා සභා වාර්තාව, පිළිගැනීම සුදුසු බව ගරු සභාපති එම්.ඩී.නන්දන ගුණතිලක මහතා විසින් යෝජනා කල අතර ,ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා විසින් ස්ථිර කරන ලදුව 2022.11.03 වන දින මහා සභා වාර්තාව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන -

(ආ.1) නාගරික සංවර්ධන අධිකාරිය විසින් පාණදුර පොදු වෙළඳ පොළ ඉදිකිරීම සඳහා ලබන වසරට මිලියන 500 ක මුදලක් වෙන්කර ඇති බව සභාව වෙත දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත නිවේදනය කරන ලදී.

(ආ.2)වායුගෝලයේ දුවිලි අංශු වැඩිවී මෙවන විට ඇති වී ඇති වෙනස්කම් හේතුවෙන් මේ අවස්ථාවේ යලිත් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව ගැටළුකාරී බවක් ඇති වී ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත නිවේදනය කරන ලදී.

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා - නැත

(ඈ) සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම - නැත

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා

(ඊ.1) ගරු සභාපති නන්දන ගුණතිලක මැතිතුමා, ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.1.1) 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම මෙමගරු සභාවට යෝජනා කර සිටින ලදී. 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සභාගත කරන ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.1.2) 2023 වර්ෂයේ කසල කළමනාකරණ සැලැස්ම මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.2023 වර්ෂයේ කසල කළමනාකරණ සැලැස්ම සභාගත කරන ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

ගරු සභාපතිතුමා

ලබන වසරේ කසල අවසන් බැහැරලීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති අතර එම ටෙන්ඩර් වලට අනුව මෙම වර්ෂයේ කසල ලෝඩ් 01 කට ගෙවූ මුදලට වඩා වැඩි මුදලක් ගෙවීමට සිදුවී තිබෙනවා.එමනිසා ඉදිරියේදී මෙම කසල කළමනාකරණය සඳහා යම් වැඩපිළිවෙළකට යොමු විය යුතු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

මේවන විට වෙනත් බාහිර පාර්ශවයක් වෙත ලබාදෙන්නේ කුමන කසලද යන්න දැනගත හැකිද යන්න විමසා සිටින ලදී.

ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා

කසල අංගනයේ කසල තේරීමට සිටින්නේ සාගර මාවතේ කසල රැස්කරගෙන එන්නාවූ සේවක මහතා පමණයි.මෙම කසල තේරීම සඳහා තවත් සේවකයින් දෙදෙනෙක් හෝ යෙදවීමට කටයුතු කළ හොත් කසල සඳහා යන වියදම යම් තාක් දුරට අඩුකරගත හැකි බව පවසා සිටින ලදී.

පෙ.ව.10.45 - ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා විසින් ගරු සභාව , කාරක සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව,කාරක සභා අවස්ථාවට පත්වන ලදී.

පෙ.ව. 10.50 - ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා විසින් කාරක සභාව ,ගරු සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව,ගරු සභා අවස්ථාවට පත්වන ලදී.

ගරු සභාපතිතුමා

මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා පවසා සිටි ආකාරයට නගරයෙන් එක්රැස් කරන්නාවූ කසල , කසල රථවලදීම තෝරා වෙන්කර ගැනීමක් සිදුවෙනවා.එමෙන්ම නොදිරන දහනය කළ හැකි කසල කෙරවලපිටිය වෙතත් ඉඳුල් වැනි දිරණ කසල පොහොරවත්ත වෙතත් යොමු කරනවා.එම ස්ථාන දෙක වෙත යවා ඉතිරිවන කසල තමයි දැනට GFC Machinery (Pvt) Ltd ආයතනය වෙත යොමු කරන්නේ.කෙසේ හෝ මීළඟ සෞඛ්‍ය කමිටුව වෙත පසුගිය කාල සීමාව තුළ මෙම ස්ථාන 03 සඳහා යොමුකරන ලද කසල ලෝඩ් ගණනත් ඒ සඳහා වැය වූ මුදලත් පිළිබඳ වාර්තාවක් ලබාදීමට කටයුතු කරන්න.එහිදී ලබන වසරේ කසල සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග කුමක්ද යන්න සාකච්ඡා කර තීරණය කරමු යැයි පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2023 වර්ෂයේ කසල කළමනාකරණ සැලැස්ම අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.1.3) 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී. 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සභාගත කරන ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.1.4) කොට්ඨාශ අංක 05,හොරණ පාරේ ,වරිපනම් අංක 142/07 හා 142/08 දරණ ස්ථාන පාණදුර ශ්‍රී සුමංගල විද්‍යාලයට අයත්ගුරු නිල නිවාස වන අතර එකී නිල නිවාස පදිංචියෙන් තොර වේ.එමෙන්ම මෙම නිල නිවාස පාසලට අයත් වන අතර පාසල් වරිපනම් බදු නිදහස් ආයතනයක් වන බැවින් වරිපනම් අංක 142/07 සඳහා පවතින රු 11875.69 ක හිඟ වරිපනම් බදු මුදල හා වරිපනම් අංක 142/08 සඳහා පවතින රු 62976.10 ක හිඟ වරිපනම් බදු මුදල කපා හැරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

වරිපනම් අංක 142/07 හා වරිපනම් අංක 142/08 සඳහා පවතින හිඟ වරිපනම් මුදලෙහි යම් වෙනසක් පවතිනවා ඒ මන්ද යන්න විමසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතා</u>

මෙහිදී මෙම නිල නිවාස දෙක පවතින්නේ විදුහල්පති නිල නිවස හා ගුරු නිල නිවස ලෙසයි.ඒ අනුව තක්සේරුවේ යම් වෙනසක් පැවතිය හැකියි.එමෙන්ම මෙම නිල නිවාස වල සිටීම වෙනුවෙන් අදාල විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වැටුපෙන් යම් මුදලක් අයකරනු ලබනවා.එබැවින් ඒ අනුව වරිපනම් වශයෙන් මුදලක් අයකළ නොහැකිද යන්න සොයා බැලිය යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා</u>

මෙම වරිපනම් අංක දෙක සඳහා එම හිඟ වරිපනම් මුදල ගණනය වී ඇත්තේ කුමන කාලසීමාවක සිටද යන්න සඳහන් නොවන බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙහිදී නගර සභා ආඥා පනතේ පාසල් වරිපනම් බදුවලින් නිදහස් බව සඳහන් කර තිබෙනවා.එමෙන්ම 2020 වර්ෂයේ තක්සේරුවේදී මෙම දේපළ දෙක වරිපනම් බදු වලින් නිදහස් කර තිබෙනවා.නමුදු 2020 වර්ෂයට පෙර තක්සේරු කර පැවති බැවින් එන්නාවූ හිඟයක් තමයි පවතින්නේ.කෙසේ හෝ නගර සභා ආඥා පනතට අනුව වරිපනම් බදු නිදහස් ආයතන

මොනවාද යන්න හා මෙම හිඟ මුදල සෑදී ඇති කාලසීමාව පිළිබඳව විස්තරය මීළඟ මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර කොට්ඨාශ අංක 05,හොරණ පාරේ ,වරිපනම් අංක 142/07 හා 142/08 දරණ ස්ථාන පාණදුර ශ්‍රී සුමංගල විද්‍යාලයට අයත් ගුරු නිල නිවාස වේ.එමෙන්ම මෙම නිල නිවාස පාසලට අයත් වන අතර නගර සභා ආඥා පනතේ 161(අ) වගන්තිය යටතේ (අධ්‍යාපනික) පාසල් ,වරිපනම් බදු නිදහස් ආයතනයක් වේ. 2020 වර්ෂයේ දේපළ තක්සේරුවේදී ද මෙම දේපළ වරිපනම් බදු වලින් නිදහස් කර ඇත.ඒ අනුව 2020 වර්ෂය දක්වා වරිපනම් බදු මුදල් ගණනය වී 142/07 සඳහා පවතින රු 11875.69 ක හිඟ වරිපනම් බදු මුදල හා වරිපනම් අංක 142/08 සඳහා පවතින රු 62976.10 ක හිඟ වරිපනම් බදු මුදල කපා හැරීමට තීරණය විය.

(ඊ.1.5)2022 වර්ෂය සඳහා සෞඛ්‍ය අංශය විසින් ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ආදායමින් රු 6,000.00 ක් වටිනා පෝෂණ මල්ලක් කසළ කළමණාකරනය කරන්නාවූ සේවකයින් 50 දෙනෙකු සඳහා පෝෂණ මලු 50 ක් ලබාදීමටත් ඒ සඳහා වැය ශීර්ෂ 124-8-1-0-1549 යටතේ ගරු පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් වියදම් දැරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

වැය ශීර්ෂය	වර්ෂය	සේවකයින් සංඛ්‍යාව	එක් අයෙකුට ඇස්තමේන්තු මුදල(රු)	මුළු ඇස්තමේන්තු මුදල (රු)
1549	2022	50	6,000.00	300,000.00

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

මෙහිදී මෙම පෝෂණ මලු ලබාදෙනු ලබන්නේ සෞඛ්‍ය සේවකයින් සඳහා පමණක්ද යන්න විමසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ආදායම සොයා ගැනීමට කටයුතු කරනු ලබන්නේ සෞඛ්‍ය සේවකයින් බැවින් මේ අවස්ථාවේ පෝෂණ මලු ලබාදීමට කටයුතු කරන්නේ එම සේවකයින්ට පමණක් යැයි පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022 වර්ෂය සඳහා සෞඛ්‍ය අංශය විසින් ඝණඅපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ආදායමින් රු 6,000.00 ක් වටිනා පෝෂණ මල්ලක් කසළ කළමණාකරනය කරන්නාවූ සේවකයින් 50 දෙනෙකු සඳහා පෝෂණ මලු 50 ක් ලබාදීමටත් ඒ සඳහා වැය ශීර්ෂ 124-8-1-0-1549 යටතේ ගරු පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව රු 300,000.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීමටත් තීරණය කරන ලදී.

(ඊ.1.6) ඩෙංගු රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදුකළයුතු වීම හා නගරය පිරිසිදු කිරීම, කාණු පිරිසිදු කිරීම සඳහා ප්‍රමාණවත් සේවක පිරිසක් අවශ්‍ය වන බැවින් හිටපු බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ උපදෙස් මත විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහනක් සඳහා දැනට ව්‍යාපෘති පදනමින් බඳවා ගෙන ඇති 2022.08.19 සිට 2023.02.19 දක්වා ක්‍රියාත්මක වූ ඩෙංගු ව්‍යාපෘතියෙහි පහත සඳහන් සේවකයින්ගේ සේවා කාලය 2023.02.21 දින සිට ඉදිරියට මාස 06 ක් සඳහා දීර්ඝ කිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

1. ටී.ප්‍රසන්න කුමාර මයා
2. නුවන් සම්පත් ෆොන්සේකා මයා
3. ඩබ්.ඩබ්.ඩබ්.අකිල නිරංජන මයා
4. ටී.උදාර චතුරංග ප්‍රනාන්දු මයා
5. කේ.ඩී.නිශාන්ත ප්‍රනාන්දු මයා
6. එච්.ආර්.තිමිල් දක්ෂිත මයා
7. පී.චමින්ද තිසේරා මයා

යෝජනා ස්ථිරත්වය : ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

මෙම සේවකයින්ගේ සේවා කාලය මාස 06 න් 06 ට දීර්ඝ කරනු ලබනවා.එමෙන්ම මෙම සේවකයින් තවත් දීර්ඝ කාලයක් සේවය කළ හැකියි.කෙසේ හෝ පෙර මෙම සභාවේ ආදේශක සේවකයින් ලෙස වසර ගණනාවක් සේවය කළ සේවක පිරිසක් සිටිනවා ස්ථිර කිරීමට කටයුතු කරන ලද්දේ වයස අවුරුදු 45 සම්පූර්ණ වූ පසු බැවින් විශ්‍රාම වැටුපක් නොලැබෙන.මෙම ඩෙංගු ව්‍යාපෘති සේවකයින්ටද ඒ දේ සිදුවිය හැකි බැවින් මේ සම්බන්ධයෙන් සභාව මැදිහත් වී යම් වැඩපිළිවෙළක් යෙදිය යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

පසුගිය සභා වාරයේදී සේවකයින් විශාල පිරිසක් ස්ථිර කිරීම සිදුකළා.එහිදී සේවකයින් 11 දෙනෙකු සිටියා වයස 45 සම්පූර්ණ වූ.මෙවන් ගැටළු ඇති සේවකයින් වෙනත් සභාවන් වලද සිටින අතර ගරු ආණ්ඩුකාරතුමා වෙතත් මෙම සේවකයින් සඳහා යම් සාධාරණයක් ඉටු කරන ලෙස තොරතුරු දන්වා තිබෙනවා.
දැනටත් සභාවේ සැලකිය යුතු පුරප්පාඩු ගණනක් පවතිනවා.රජය විසින් බඳවා ගැනීම් සඳහා අවස්ථාව ලබාදෙන්නේ නම් මේ ව්‍යාපෘති සේවකයින් එම පුරප්පාඩු සඳහා බඳවා ගත හැකියි.නමුදු දැනට එම ගැටළුව සඳහා මුහුණ දී ඇති සේවකයින් සම්බන්ධයෙන් පොදු තීරණයක් රජය විසින් ගත යුතු යැයි පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

මේවාට පැවති පසුගිය සභාවන්ද වගකිව යුතුයි.මෙම ගැටළුවට මුහුණ දී ඇති සේවකයින්ව ඒ අවස්ථාවේ පැවති පුරප්පාඩු සඳහා වයස 45 ට පෙර බඳවා ගෙන ස්ථිර කළ යුතුව තිබුණා.එසේ කළානම් එම සේවකයින්ට අසාධාරණයක් සිදුවන්නේ නැහැ යැයි පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර ඩෙංගු රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදුකළයුතු වීම හා නගරය පිරිසිදු කිරීම, කාණු පිරිසිදු කිරීම සඳහා ප්‍රමාණවත් සේවක පිරිසක් අවශ්‍ය වන බැවින් හිටපු බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ උපදෙස් මත විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහනක් සඳහා දැනට ව්‍යාපෘති පදනමින් බඳවා ගෙන ඇති 2022.08.19 සිට 2023.02.19 දක්වා ක්‍රියාත්මක වූ ඩෙංගු ව්‍යාපෘතියෙහි පහත සඳහන් සේවකයින්ගේ සේවා කාලය 2023.02.21 දින සිට ඉදිරියට මාස 06 ක් සඳහා දීර්ඝ කිරීමට තීරණය කරන ලදී.

1. ටී. ප්‍රසන්න කුමාර මයා
2. නුවන් සම්පත් ෆොන්සේකා මයා
3. ඩබ්.ඩබ්.ඩබ්.අකිල නිරංජන මයා
4. ටී.උදාර චතුරංග ප්‍රනාන්දු මයා
5. කේ.ඩී.නිශාන්ත ප්‍රනාන්දු මයා
6. එච්.ආර්.තිමිල් දක්ෂිත මයා
7. පී.චමින්ද තිසේරා මයා

(ඊ.1.7) 2022 ඔක්තෝබර් හා නොවැම්බර් මස කමිටු වාර්තා අනුමැතිය සඳහා මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

(ඊ.1.7.1) 2022.10.26 මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.10.26 දිනැති මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

<u>පාණදුර නගර සභාව</u>
<u>පෙත්සම් කාරක සභාව</u>

දිනය - 2022.10.26
වේලාව - පෙ.ව 10.00
ස්ථානය - පාණදුර නගර සභාවේ කමිටු රැස්වීම් ශාලාව

<u>කමිටු සාමාජිකයන්</u>

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත.
2	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත.
3	ගරු නාගරික මන්ත්‍රී	පියසේන ප්‍රනාන්දු මහතා	ඇත.
4	ගරු නාගරික මන්ත්‍රිනී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත.
5	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත.
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත.
7	ගරු නාගරික මන්ත්‍රී	එච්. වන්දිම ඒ. පීරිස් මහතා	ඇත.

8	ගරු නාගරික මන්ත්‍රී	එම්.පද්මසිරි සිල්වා මහතා	නැත

<u>සහභාගී වූ නිලධාරීන්</u>

තනතුර	නම	පැමිණීම ඇත/නැත
වැඩ අධිකාරී	කේ.පී මායාරත්න මයා	නැත
මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මයා	නැත
තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර් තුෂාරා මිය.	ඇත
තාක්ෂණ නිළධාරී	එම්.ජී.සී.පී විජේරත්න මිය.	ඇත
සංවර්ධන නිලධාරී (නීති)	ඉමල්කා වේරගම මිය.	ඇත
ප්‍රජා සංවර්ධන නිලධාරී වෙනුවට	ඉරෝමි කුරුප්පු ආරච්චි මිය	නැත
කළමනාකරණ සේවා නිලධාරි	එස්.ඩී.වික්‍රමරත්න මිය.	ඇත

<u>01.පෙත්සම</u> - පුබුදු පෙදෙස,වලව්වත්ත, වැකඩ පිහිටි අනතුරුදායක පොල් ගස සම්බන්ධ ගැටළුව

පැමිණිලිකරු - උපුල් සරත් ද සිල්වා අතුරලිය

වග උත්තරකරු - H.S.H.K සිල්වා මයා,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - පැමිණිළිකාර පාර්ශවය විසින් 2022.09.13 දිනැතිව දැනුම් දී ඇති ලිපිය අනුව අනතුරුදායක පොල් ගස සම්බන්ධයෙන් නගර සභාවේ නිලධාරි මහත්ම මහත්මීන් බැලීම අවශ්‍ය නොවන බව හා ඒම ලිපි අවලංගු කරන ලෙසට දැනුම් දී ඇති බැවින් පොල් ගස මගින් ඇතිවිය හැකි අනතුරු තත්වයකදි එහි වගකීම දෙපාර්ශවය විසින් භාරගත යුතු බවත් දන්වා යැවීමට තීරණය විය.

<u>02.පෙත්සම</u> - ගලගොඩ පන්සල පාර නො 21 දරණ ස්ථානයේ සිදු කර ඇති අනවසර ඉදිකිරීමක් සම්බන්ධව.

පැමිණිලිකරු - ජේ.සේපාලිකා හේවානායක මිය,

වග උත්තරකරු - සුරේනිකා අබේසේකර මිය

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - මෙම පෙත්සම් විභාගයේදි දෙපාර්ශවය විසින් පවසා සිටියේ එකිනෙක පාර්ශවය විසින්ම අනවසර ඉදිකිරීම් සිදුකර ඇති බවය.

වග උත්තරකාර පාර්ශවය වන සුරේනිකා අබේසේකර මිය දන්වා සිටියේ පැමිණිළිකාර පාර්ශවය විසින් යාබද ගොඩනැගිල්ල ඉදිකිරීමේදි යොදා ඇති මූලික කොන්ක්‍රිට් කණු දිරාපත්ව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ඇතිවන අනතුරුදායක තත්වය වලකාදෙන ලෙසට ඉල්ලා සිටින ලදී.ඒ සඳහා පිළියම් කිරීමට පැමිණිළිකාර පාර්ශවයට නිවස තුලින් යාමට හා ඊමට පහසුකම් සලසා දීමටත් එකතාවය ප්‍රකාශ කරන ලදි.

පැමිණිළිකාර පාර්ශවය විසින් ඉදිකර ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටස් ඉදිකිරීම ආරම්භ කිරීමට පෙර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාවක් ලබාගත යුතු බවත් අනුමත සැලසුමේ වලංගු කාලය ඉක්මවා ඇති බැවින් නැවත සංශෝධිත ගොඩනැගිලි සැලසුමක් අනුමත කරගත යුතු බවත් දැනුම් දෙන ලදි.

දෙපාර්ශවය විසින් දිගින් දිගටම පවසා සිටියේ එකිනෙක පාර්ශවයන් විසින් අනවසර ඉදිකිරීම් සිදුකර ඇති බව වුවද ඔවුන් සතු මානක සැලසුම් අධික්ෂණයේදි පැමිණිළිකාර පාර්ශවය විසින් ප්‍රතිවිරුද්ධ ප්‍රකාශයන් සිදුකළ බැවින් දෙපාර්ශවය විසින්ම තම මායිම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු බවත් ඒ අනුව ගොඩනැගිලිවල අනතුරුදායක තත්වය මගහරවා ගැනීමට කටයුතු කළ යුතු බවද දැනුම් දෙන ලදි.

ඉන් අනතුරුව දෙපාර්ශවය විසින්ම නව ඉදිකිරීම් කරනනේ නම් ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර සංශෝධිත ගොඩනැගිලි සැලසුම් අනුමත කරගත යුතු බවත් දැනුම් දෙන ලදි.

03.<u>පෙත්සම</u> **- පරිසරයට හා නගර සභා නීතිවලට පටහැනිව කටයුතු කිරීම ගංගා මාවත පානදුර**

පැමිණිලිකරු - ගංගා මාවතේ පදිංචිකරුවන්

වග උත්තරකරු - ගංගා මාවත පටන් ගන්නා ස්ථානයේ මීටර් 50 ක් ඇතුලත ප්‍රදේශවාසින්

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> **- මෙම පැමිණිල්ලට අදාල මාර්ගය ආරම්භ වන ස්ථානයේ ඉඩමේ ඇති අනතුරුදායක පොල් ගස අධික උසක් ඇති බැවින් කපා ඉවත් කළ යුතු බව දන්වා යැවීමට ද එම මාර්ගයේ අඩි 100 ක් දුරට යන තෙක් මාර්ගය දෙපස වාහන නැවැත්වීම තහනම් යනුවෙන් පුවරු දෙකක් සිටුවීමට කටයුතු කිරීමටත්, මාර්ගයේ පවතින බාධක (කුණු කසල, පස්, ආදිය) සභාව මගින් ඉවත් කර පිරිසිදු කිරීමටත් තීරණය විය.**

<u>4.පෙත්සම</u> - නිවසේ ආරක්ෂක තාප්පයට යා කර මඩුවක් සෑදීම හා වැසි ජලය තාප්පයට යොමු කිරීම සම්බන්ධවයි.

පැමිණිලිකරු - එස්.පී.ප්‍රනාන්දු මිය,

වග උත්තරකරු - උෂානි එදිරිමාන්න,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> **- වග උත්තරකාර පාර්ශවය විසින් නිවසේ ඉදිකිරීම් අවසන් කර අනුකූලතා සහතිකය ලබා ගැනීමට පෙර පැමිණිළිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති තාවකාලික මඩුව කඩා ඉවත් කළ යුතු බව දන්වා යැවීමට තීරණය විය.**

05. <u>පෙත්සම</u> **- පාණදුර සොලමන් මාවතේ අංක 54 දරණ පිඹුරේ ජලය බැස්සවීම සඳහා වෙන් කර ඇති කාණුව නිසි පරිදි සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.**

පැමිණිලිකරු - ඩබ්.කේ පී ප්‍රනාන්දු මයා,

වග උත්තරකරු - පී.ආර්.ආර් ප්‍රනාන්දු මිය.

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - මෙම ගැටළුවට තුඩු දී ඇති කාණුව සහිත ඉඩම මැනුම් කිරීමට යොමු කර ඇති පී.අජිත් පී ද සිල්වා මිනින්දෝරු මහතාද සම්බන්ධ කර ගනිමින් දෙපාර්ශවයද ගෙන්වා අද දින පෙත්සම් කාරක සභාවේදි නැවත සාකච්ඡා කිරීමට කටයුතු කළද එදිනට මිනිදෝරු මහතා පැමිණිය නොහැකි බව දැනුම් දුන් බැවින් නැවත දිනයක් යෝජනා කර ගැටළුව සලකා බැලීමට කටයුතු කළ යුතු බව පෙත්සම් කාරක සභාව තීරණය කරන ලදි.

06. <u>පෙත්සම</u> **- තාප්පය හා නගර සභා මාර්ගය අවහිර වන ලෙස ගල්ගොඩ ගැසීම හා කුණු රැස්කර පුච්චා දැමීම නතර කර ගැනීම.- නො 12/34, මැදවේල්ල පාර දෙවන අතුරු පාර,**

පැමිණිලිකරු - අජිත් ජයරත්න මයා,

වග උත්තරකරු - නිල්මිණි මිය,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - මෙම ගැටළුවට තුඩු දී ඇති මාර්ගය පෙත්සම් කාරක සභාව විසින් ස්ථාන පරීක්ෂාවක් සිදු කරන ලද අතර පැමිණිකරු විසින් 2022.09.27 දිනැතිව දන්වා ඇති බාධක ඉවත් කර ඇති බව වාර්තා කර ඇත.

07. <u>පෙත්සම</u> **- 685 D , සාගර පෙදෙස,වසමේ පොදු ළිද හා සභාව සතු ඉඩම සම්බන්ධවයි.**

පැමිණිලිකරු - සෞම්‍යා මධුෂානි ඇතුළු සාගර මාවත ප්‍රදේශවාසින්

වග උත්තරකරු - කේ. ගාමිණි සුදත් මයා,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - මෙම ගැටළුවට පාදක වී ඇති ඉඩමට අදාලව පැමිණිළිකාර පාර්ශවය විසින් ප්‍රකාශ කරන ලද්දේ එම ඉඩමේ මීට වසර 30 කට පෙර සිට පෙර පාසලක් පැවති බවත් එය රජයෙන් පවත්වාගෙන ගිය පෙර පාසලක් වන බවත් හා එම ඉඩමේ පවතින ළිද පොදු ළිදක් බවත්ය.එම ප්‍රදේශයේ ජල සැපයුම නොමැති අවස්ථාවලදි නේවාසික අවශ්‍යතා සඳහා ජලය ලබාගැනීම සඳහා පවතින එකම ළිද එය බවත් එම ළිද පොදු පාවිච්චියට නිදහස් කර දෙන ලෙසත් අදාල ඉඩම පොදු කටයුතු සඳහා නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

අදාල ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් නීත්‍යානුකූලභාවය තවදුරටත් පරීක්ෂා කිරීම සඳහා ආසන්නතම ඉඩම්වල ඔප්පු හා මානක සැලසුම් පිටපත් ඉදිරිපත් කරන ලෙස අත්සන් ලේඛණයේ සඳහන් පැමිණිලිකාර පාර්ශවය වෙනුවෙන් පැමිණ සිටි පිරිසට දැනුම් දෙන ලදී.

වග උත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කරන ලද්දේ එම ඉඩම් මිලදී ගත් එකක් වන බවත් ඊට අදාල ඔප්පු හා පෙළපත් සටහන් ඔවුන් සතුව පවතින බවත් මින් මාස දෙකකට පෙරදී ඔවුන් සභාව වෙත කැඳවන ලද අවස්ථාවේදී එම තොරතුරු සභාවට ලබා දුන් බවත්ය.

පොදු පරිහරණය සඳහා ළිද සහිත ඉඩම් කොටස නිදහස් කිරීමට වග උත්තරකාර පාර්ශවය මනාපය ප්‍රකාශ කරන ලද බැවින් , අනෙක් ඉඩම් කොටසේ අයිතිය පිළිබඳ නීත්‍යානුකූලභාවය සනාත කර ගැනීමේ කටයුතු තවදුරටත් තොරතුරු සොයා බැලීම කඩිනම් කිරීමටත් , ළිද සහිත ඉඩම් කොටස පොදු පරිහරණය සඳහා භාවිතා කිරීමට හැකි වන ලෙස කටයුතු කිරීමටත් තීරණය කරන ලදි.

08.පෙත්සම - ඩයස් පෙදෙස,වරිපනම් අංක 76 දරණ ඉඩමේ මායිම වෙනස් කිරීම.

පැමිණිලිකරු - ඊ.ජී.පුෂ්පකාන්ති මිය,

වග උත්තරකරු - ඩී.වී.රේණුකා ප්‍රියදර්ශනි මිය,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - මෙම ගැටළුවට අදාල පැමිණිල්ලේ ඉල්ලීම අනුව දෙපාර්ශවයේ එකගතාවය මත මාස 03 ක් ඇතුලත වග උත්තරකාර පාර්ශවයේ පැරණි නිවසේ ඇති වහලේ නෙරුම් ඉවත් කිරීමටත් , මායිම් තාප්පය නිවැරදි කිරීමටත්, පෙත්සම් කාරක සභාව ඉදිරියේදී එකතාවය ප්‍රකාශ කරන ලදි.

මායිම් බිත්තියේ ඇති වැසි ජල බස්නා නල මාර්ග ඉවත් කිරීම සඳහා සෘජුවම එකග විය නොහැකි බව වග උත්තරකාර පාර්ශවය ප්‍රකාශ කළ බැවින් ඒ සඳහා විකල්ප ක්‍රමවේදයක් තිබේ ද යන්න උපදෙස් ලබාදීම සඳහා සභාවේ තාක්ෂණ නිලධාරීන් විසින් ස්ථාන පරීක්ෂාවක් සිදු කිරීමට තීරණය විය.

09. පෙත්සම - වත්තල්පොල පාර නො. 31/3 ,නිවසට ආසන්නයේ ප්‍රවේශ අයිතියක් නොමැතිව මාර්ගයට ගේට්ටුවක් දැමීම.

පැමිණිලිකරු - එච්.ඩී.රංග විපුල් කුමාර මයා,

වග උත්තරකරු - ඩබ්.ඒ. සරෝජිනි මිය,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - මෙම ගැටළුවට අදාල මාර්ගය සංවර්ධනය කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදුකර ඇති නිසා මෙම මාර්ගය සංවර්ධනය කිරීමෙන් අනතුරුව පොදු ප්‍රවේශ මාර්ගයක් ලෙස ගැනෙන්නේද නැතිනම් සීමිත ප්‍රවේශ අයිතියක් හිමි පුද්ගලයන්ට පමණක් පවතින්නේද යන වග පැහැදිලි කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වා යැවීමට තීරණය විය.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.10.26 මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ ,අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.1.7.2) 2022.11.11 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.11.11 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

සෞඛ්‍ය,පරිසර හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව

දිනය : - 2022.11.11

වේලාව : - පෙ.ව. 10.00

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු උපසභාපති	පී.එච්.විල්මන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	පුෂ්පා ෆොන්සේකා මිය	ඇත
8	ගරු නාගරික මන්ත්‍රී	එච්.චන්දිම ඒ.පීරිස් මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ගයා උදයංගනී ද සිල්වා මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මහතා	ඇත
4	අංශ ප්‍රධානී (සෞඛ්‍ය)	එච්.ටී.හෙට්ටිආරච්චි මිය	ඇත
5	සංවර්ධන නිළධාරී	ඉරෝමි කුරුප්පුආරච්චි මිය	ඇත
6	සෞඛ්‍ය පරිපාලක	ආර්.ආර්.ඒ. වික්‍රමසිංහ මහතා	ඇත
7	සෞඛ්‍ය පරිපාලක	එච්.එම්.දිල්හාර නන්දනතිලක මහතා	ඇත
8	සෞඛ්‍ය උපපරිපාලක	එච්.එස්.එම්.කේ.ප්‍රනාන්දු මහතා	ඇත
9	සෞඛ්‍ය උපපරිපාලක	බී.නිමල්සිරි පෙරේරා මහතා	ඇත
10	සෞඛ්‍ය උපපරිපාලක	කේ.ජී.එම්.සුසිත චාමර මහතා	ඇත

01. මිනුවම්පිටිය සුසාන භූමියේ සමරුඵලකවල දිග පළල තීරණය වුවත් උස පිළිබඳව ගැටළු පවතින බැවින් ඒ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබාගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

සමරුඵලකවල උපරිම උස අඩි 5 ක් ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. කසළ අංගනයට ගෙනවිත් භාර දෙන පහත සඳහන් නොදිරණ කසල සඳහා කිසියම් ප්‍රතිශත මුදලක් (20% හෝ 30% ක් වැනි) පාරිභෝගිකයින්ට ගෙවා මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

i. ටින් - රු 35.00
ii. සුදු විදුරු - රු 14.50
iii. පෙට් - රු 51.00
iv. ප්ලාස්ටික් - රු 60.00
v. බියර් ටින් - රු 180.00
vi. කාඩ්බෝඩ්

ඉහත ද්‍රව්‍ය වලට අමතරව යකඩ,ඇළුමිනියම් හා වෙනත් ලෝහද පොල්කටුද කසල අංගනයට භාර ගනිමින් සභාව විසින් අදාළ ද්‍රව්‍ය 1 Kg ක් විකිණීමේදී ලබාගන්නා වූ මුදලින් 50% ක මුදලක් පාරිභෝගිකයින්ට ලබාදීමට කටයුතු කිරීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

03. පරිසර පොළට සමගාමීව කසල අංගනය වෙත ගෙන එන ප්‍රතිචක්‍රීකරණය සඳහා මිලදී ගනු ලබන කසල වල බර මැනීම සඳහා කාර්යය විශේෂ වූ තරාදි 02 ක් ලබා ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

ඉලෙක්ට්‍රොනික බිම් තරාදියක් හා ඉලෙක්ට්‍රොනික එල්ලන තරාදියක් මිලදී ගැනීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

4.1 පාණදුර නගරයේ ජලභීතිකා රෝගය සෑදි කිහිපදෙනෙකු ජීවිතක්ෂයට පත්වී ඇති බවට තොරතුරු ලැබී ඇති බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර නගරයේද සුනඛ ගහණය අධික බැවින් එම සුනඛයින්ට ජලභීතිකා එන්නත් කිරීමද ව්‍යාන්ධකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමද කඩිනමින් ඉටු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.2 පෙර භූමදානය කළ දේහයන්හී භෂ්මාවශේෂ ගොඩදමා ඒවා මල් පෝච්චියක හෝ වෙනත් ස්ථානයක තැන්පත් කිරීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලීම් කරමින් මෙවන විට සෞඛ්‍ය අංශය වෙත ඉල්ලීම් ලිපි 03 ක් යොමු වී තිබෙනවා යැයි මහජන සෞඛ්‍ය පරීක්ෂක සම්පත් මොරමුදලි මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මේ පිළිබඳව තීරණයක් ලබාදීමට පෙර මෙවන් කාර්යයක් ඉටු කිරීම සම්බන්ධයෙන් පවත්නාවූ නීති පිළිබඳව විමසීම් කර කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.3 පාණදුර රෝහලේ කල්ඉකුත්වූ බෙහෙත් තොගයක් වලදැමීම සඳහා වලක් කැපීමට සභාව සතු ජේසීබී රථය ඉල්ලීම් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර නගරයේ පවතින රාජ්‍ය ආයතනයක් බැවින් ජේසීබී රථය නොමිලේ රෝහල වෙත ලබාදීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.4 චන්ද්‍රසේකර මාවතේ කුණු ගොඩගසනු ලබන අතර විනිශ්චකාර බංගලාව ආසන්නයේ ඇති ගස්වල කොළ වැටී එම මාර්ගය කොළ වලින් පිරී ඇති බව ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මිය කමිටුව වෙත පවසා සිටි අතර විනිශ්චකාර බංගලාව ආසන්නයේ ඇති ගස්වල අතුකපා දැමීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.5 නල්ලූරුව ,බෝධිරුක්ඛාරාම පාරේ ඇති බෝගස ඉතා අනතුරුදායක මට්ටමේ පවතින බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර එම ගස කපා දැමීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටුකර එම බෝගස කපාදැමීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.6 දුම්රිය පොළවෙත යන මාර්ගයේ අළුතින් දැමූ මාළු වෙළඳසැල අසල පරණ යකඩ බඩු රැස්කරන ස්ථාන 02 ක් පවතින අතර ආවරණයක් රහිතව පැවතීම නිසා එම ස්ථානවල ජලය රැඳීමෙන් ඩෙංගු මදුරුවන් බෝවීමේ හැකියාවක් පවතින බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටි අතර අදාළ ස්ථානය පරීක්ෂා කර ආවරණයක් සකස් කර ගැනීමට උපදෙස් ලබාදෙන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.7 වෙරළෙහි පවතින සුනාමියට අසුවී ඉතිරිව පවතින සංරක්ෂණය කළ යුතුයි කියා අදහසක් පවතින ගොඩනැගිල්ලේ ගල් ගලවා දැමීමට එම ස්ථානයේ ඇති කඩ කාමරයක පුද්ගලයෙකු කටයුතු කර ඇති බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටි අතර ඒ පිළිබඳව කඩිනමින් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.8 පාණදුර,ලක්රස ආපනශාලාවේ ඉඳුල් කාණුවට දමන බවට පැමිණිලි ලැබී ඇති බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර එම ස්ථානය කඩිනමින් පරීක්ෂා කිරීමට ලක්කර අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.11.11 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ ,අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.1.7.3) 2022.11.11 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.11.11 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

දිනය : - 2022.11.11
වේලාව : - ප.ව. 12.30
ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	නැත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්. තුෂාරා මිය	ඇත
4	තාක්ෂණ නිළධාරී	ප්‍රසාදි විජේරත්න මිය	ඇත
5	තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මහතා	ඇත
6	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
7	සංවර්ධන නිළධාරී(නීති)	ඉමල්කා වේරගම මිය	ඇත

8	පරිපාලක	ඩබ්.නිමල් අල්විස් මහතා	ඇත
9	වැඩ අධීක්ෂක	ජේ.අමිත් ඩිල්ෂාන් මහතා	ඇත
10	වැඩ අධීක්ෂක	ඩබ්.එම්.සී.එල්.කුමාර මහතා	ඇත

01. PUC/5/4/1/5/2021 මිනුවන්පිටිය ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම ලිපිගොනුවට අනුව, 2022.10.11 දිනැති කර්මාන්ත කමිටුවේ නිර්දේශය පරිදි ආදාහනාගාරයේ අළුත්වැඩියාව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා හා තාක්ෂණ නිළධාරීන් විසින් නිරීක්ෂණය කරන ලදී .ඒ අනුව ආදාහනාගාරයේ අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කර ඇති රු 395,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 395,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

02. PUC/5/4/1/6/2020 ප්‍රධාන කාර්යාලය සඳහා සීසීටීවී කැමරා පද්ධතියක් සවි කිරීම ලිපිගොනුවට අනුව,ප්‍රධාන කාර්යාලයේ කැමරාවල පවතින දෝශ සොයා බැලීමට 2022.05.20 හා 2022.07.29 දිනැතිව සිදුකරන ලද ස්ථාන පරීක්ෂණ සඳහා එක් වරකට රු 6000.00 බැගින් වාර 02 ක් සඳහා රු 12000.00 ක්ද වැට් 12% සඳහා රු 1440.00 ක මුදලද ඇතුළුව මුළු මුදල වන රු 13440.00 ක මුදල ඇපෝජි ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 13,440.00 ක මුදල ඇපෝජි ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

03. UCP/05/02/02/2022 පොදු ගොනුව 2022 ලිපිගොනුවට අනුව ශෂී ඩිලාන් සිල්වා මහතා විසින් නල්ලූරුව,ජයන්ති මාවතේ 01 වන පටුමහෙහි ඇති බුදු මැදුරට විදුලිය ලබා ගැනීම සඳහා 2022.10.03 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක් කර ඇත.මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අදාළ බුදු මැදුර සඳහා විදුලිය ලබාදීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04. PUC/5/4/1/26/2021 පාණදුර ,සමුද්‍ර මාවත,මෙල්වින් පටුමඟේ පළමු කොටස සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කරන ලද රු 1,000,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 1,000,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

05. එස්.ආනන්ද ජයරත්න හා තමරා පුෂ්පමංජරී ජයරත්න යන අය විසින්,ප්‍රශ්නගත ඉඩම හරහා පාණදුර නගර සභාව විසින් කාණුවක් කැපීම සම්බන්ධව ව්‍යවස්ථාපිත බලයක් නොමැති බව ප්‍රකාශ කිරීම සඳහා පවරන ලද නඩු කටයුත්ත වෙනුවෙන් මේ දක්වා සභාව විසින් වැය කර ඇති වියදම පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් ඉල්ලා සිටින ලද තොරතුරු පහත පරිදි කර්මාන්ත කමිටුවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- උක්ත කරුණ සම්බන්ධයෙන් පාණදුර දිසා අධිකරණයේ පවරන ලද 2386/L දරණ නඩුව වෙනුවෙන් පෙනී සිටීම සඳහා නීතිඥ තනූජා ද සිල්වා මිය වෙත ගෙවන ලද මුදල රු 1,39,000.00
- නඩුවේ පැමිණිල්ල නිශ්ප්‍රභා කරමින් දෙන ලද තීන්දුවට එරෙහිව කළුතර සිවිල් අභියාචනා මහාධිකරණය වෙත කරන ලද අභියාචනා සම්බන්ධ නඩුව (02/19F) සඳහා පෙනී සිටින නීතිඥ අජිත් සපරමාදු මහතා වෙත නඩුව ආරම්භයේ සිට මේ දක්වා පහත පරිදි ගෙවීම් කර ඇත.

2022.04.27 දින පෙනී සිටීම සඳහා ගාස්තුව	= රු 20,000.00
2022.07.20 ලිඛිත දේශන ඉදිරිපත් කිරීම සඳහා ගාස්තුව	= රු 20,000.00
2022.08.30 දින පෙනී සිටීම සඳහා ගාස්තුව	= රු 20,000.00
	= රු 60,000.00

ඒ අනුව මෙම නඩුව වෙනුවෙන් මේවන විට රු 1,99,000.00 (රු 1,39,000.00 + රු 60,000.00) ක මුදලක් වැය වී ඇත.

කර්මාන්ත කමිටුවේ අවධානය යොමු විය.

06.සාකච්ඡා කරන ලද වෙනත් කරුණු

6.1 PUC/5/4/1/27/2021 පාණදුර ,ශ්‍රී සුමංගල බාලිකා විදුහල ඉදිරිපිට ,සභා අරමුදලින් සංවර්ධනය කර ඇති මාවතේ සපත්තු කාණු පද්ධතියක් ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කරන ලද රු 300,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 300,000.00 ක ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.2 PUC/5/4/1/28/2022 ද සිල්වා මාවත කාණු පද්ධතිය පෙර නිම කරන ලද කාණුවට යා වන පරිදි සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කරන ලද රු 1,144,858.93 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 1,144,858.93 ක ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී

6.3 PUC/5/4/2/1/2022 සිරිල් සල්ගාදු මාවත කොන්ක්‍රීට් කිරීම ලිපිගොනුවට අනුව එම ව්‍යාපෘතිය නිම කිරීම වෙනුවෙන් සකසා ඇති අවසන් බිල්පතෙහි සඳහන් සම්පූර්ණ මුදල රු 1,714,016.89 කි.එම මුදලින් 10% අතරඳවුම් මුදල වන රු 171,401.69 හා ප්‍රමාද ගාස්තු මුදල වන රු 1396.66 ක මුදල අඩුකර ඉතිරි මුදල වන රු 1,541,218.54 ක මුදල,සියපත කාන්තා කාර්ය සංවිධානය වෙත ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 1,541,218.54 ක මුදල,සියපත කාන්තා කාර්ය සංවිධානය වෙත ගෙවීම,කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.4 PUC/5/4/3/35/2022 ප්‍රධාන පුස්තකාලයේ වැසිකිළිය සකස් කිරීම ලිපිගොනුවට අනුව,එම ව්‍යාපෘතියේ වැඩ නිම වී ඇති බැවින් ඒ වෙනුවෙන් සකසා ඇති අවසන් බිල්පතෙහි සඳහන් වන රු 2,029,354.81 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 2,029,354.81 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.5 PUC/5/4/1/32/2022 රහල් මාවත කාණුව ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කරන ලද රු 1,400,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 1,400,000.00 ක ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.6 PUC/5/4/1/9/2022 වැකඩ පෙර පාසලේ ඉහළ මහළ ඉදිකිරීම අදියර 2 (ජනෙල් දොරවල් සවිකිරීම) ලිපිගොනුවට අනුව, පසුගිය කර්මාන්ත කමිටුවේදී සාකච්ඡා කළ පරිදි හා 2022.04.07 මහා සභා තීරණය පරිදි සභාවේ පවතින ලී උපයෝගී කරගෙන දොර ජනෙල් සෑදීමේදී බැල්කනිය භාවිතා කිරීම අපහසු වන බැවින් ලී වලින් තල්ලු කරන ජනේල සෑදීම ප්‍රායෝගික නොවන බැවින් ඇලුමිනියම් යොදා ගෙන දොර ජනෙල් සෑදීම සඳහා සකස් කරන ලද රු 2,350,000.00 ක් වටිනා ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 2,350,000.00 ක් වටිනා ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.7 PUC/5/4/3/31/2022 ටයිටස් ගුණතිලක මාවත කාණුව ඉදිකිරීම (ද සිල්වා මාවතේ සිට ටයිටස් වෙල් යාය දක්වා කොටස) ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කරන ලද රු 370,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 370,000.00 ක ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.8 PUC/5/4/3/30/2022 අශෝක මාවත කාණුව ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කරන ලද රු 490,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 490,000.00 ක ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.9 PUC/5/4/1/29/2022 තන්තිරිමුල්ල පුස්තකාලයේ පැරණි කොටස් කඩා ඉවත් කිරීම ලිපිගොනුවට අනුව,තන්තිරිමුල්ල පුස්තකාලයේ ඉදිකිරීම් සිදුකිරීමට බාධාවක්ව පවතින, අබලන් හා වහලය කඩා වැටුණු පැරණි බිත්ති කොටස් කඩා ඉවත් කිරීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

තන්තිරිමුල්ල පුස්තකාලයේ පැරණි කොටසේ අබලන් හා වහලය කඩා වැටුණු පැරණි බිත්ති කොටස් කඩා ඉවත් කිරීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.10 PUC/5/4/3/19/2021 ඕබට් සිල්වා ළමා හා මාතෘ සායනය පිහිටි ගොඩනැගිල්ලේ උඩුමහළ ඉදිකිරීම අදියර 2 ලිපිගොනුවට අනුව ,එම ව්‍යාපෘතියට අදාල ගොඩනැගිල්ලෙහි පාවිච්චිය සඳහා එහි තවත් නිම විය යුතු පහත වැඩ කොටස් නිම කිරීමට ඇස්තමේන්තු සකස් කිරීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

01. පොළොවෙහි නිමාව සඳහා ටයිල් අතුරා සකස් කිරීම
02.ඇතුළත හා පිටත තීන්ත ආලේප කිරීම
03.සිවිලිම සකස් කිරීම
04. දොර හා ජනේල සකස් කිරීම හා සවිකිරීම
05. වැසිකිළියෙහි බිත්ති ටයිල් අතුරා උපකරණ සකස් කිරීම

පහත වැඩ කොටස් නිම කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

01. පොළොවෙහි නිමාව සඳහා ටයිල් අතුරා සකස් කිරීම
02.ඇතුළත හා පිටත තීන්ත ආලේප කිරීම
03.සිවිලිම සකස් කිරීම
04. දොර හා ජනේල සකස් කිරීම හා සවිකිරීම
05. වැසිකිළියෙහි බිත්ති ටයිල් අතුරා උපකරණ සකස් කිරීම

6.11 PUC/5/4/1/8/2022 ඕබට් සිල්වා පරණ මස්ටරය පිහිටි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම අතිරේක ඇස්තමේන්තු ලිපිගොනුවට අනුව,මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය ඉටු කර ගෙන යෑමේදී එහි පැරණි කපරාරුව ගලවා නැවත කපරාරු කිරීමට සිදු විය.එහිදී පැවති යම් කොටස් ශක්තිමත් කිරීම සඳහා (වැරගැන්වීම සඳහා) යොදන ලද කොන්ක්‍රීට් අයිතම පහත දක්වන අතර,එම අමතර වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරමි.

01. ලින්ටල දැමීම සඳහා පැරණි ගඩොල් බිත්ති ඉවත් කිරීම
02. සෑම දොර ජනෙල් සඳහා කම්බි යොදා ලින්ටල දැමීම
03. නැවත ගඩොල් බිත්තිය බැඳීම
04. ඉදිරිපස පාදම යොදා කණු දමා තලා දැමීම

පහත වැඩ කොටස් නිම කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

01. ලින්ටල දැමීම සඳහා පැරණි ගඩොල් බිත්ති ඉවත් කිරීම
02. සෑම දොර ජනෙල් සඳහා කම්බි යොදා ලින්ටල දැමීම
03. නැවත ගඩොල් බිත්තිය බැඳීම
04. ඉදිරිපස පාදම යොදා කණු දමා තලා දැමීම

6.12 නගර සභා ට්‍රැක්ටර හා ට්‍රේලර සඳහා මේවන විට ඇත්තේ තෙවන පාර්ශව රක්ෂණාවරණයකි.නමුත් හදිසි අනතුරක් ඇති වුවහොත් ඒ සඳහා කිසිදු පාර්ශවයකට ප්‍රතිලාභ හිමි නොවන අතර සභාවේ මුදල් ගෙවීමට සිදු වේ.බාහිර පාර්ශව වාහනයක් හෝ ජීවිත අනතුරක් සිදුවුවහොත් වන්දි ගෙවීමට සිදුවන අතර සභාවේ අනෙකුත් වාහන සඳහා මේවන විට පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය වෙතින් විමසීම කිරීමේදී එක් ට්‍රැක්ටර සමඟ ට්‍රේලරයක් සඳහා පූර්ණ රක්ෂණාවරණය ලබාදීමට වසරක් සඳහා රු 10,000.00 ක අවම මුදලක් අයකරන බව දන්වා සිටින ලදී.මේවන විට තෙවන පාර්ශව රක්ෂණාවරණය සඳහා රු 5500.00 ක මුදලක් වසරක් සඳහා සභාව විසින් ගෙවනු ලබයි.

ඒ අනුව සභාව සතු ට්‍රැක්ටර හා ට්‍රේලර සඳහා සම්පූර්ණ රක්ෂණාවරණයක් ලබාගැනීමට කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

සභාව සතු ට්‍රැක්ටර සහ ට්‍රේලර සඳහා සම්පූර්ණ රක්ෂණාවරණයක් ලබාගැනීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලද අතර අනතුරුදායක වැඩහී නිරතවී සිටින සේවකයින්හට රක්ෂණාවරණයක් ලබාදීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කිරීමට කටයුතු කරන ලෙසද නිර්දේශ කරන ලදී.

6.13 මිනුවම්පිටිය ආදාහනාගාරය වෙත ගෑස් ගෙන යනු ලබන බට 06 න් 03 ක් ක්‍රියාවිරහිත තත්ත්වයේ ඇති බව එහි සේවකයින් දන්වා සිටි බවත් මිනුවම්පිටිය සුසාන භූමියේ ගේට්ටුව ආසන්නයේ මුර කුටියක් සෑදිය යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා කමිටුව වෙත පවසා සිටි අතර ආදාහනාගාරය ආසන්නයේ ඇති ගොඩනැගිල්ල අළුමුට්ටි,හා අනෙකුත් ආම්පන්න තැබිය හැකි ලෙසත සකස් කරන ලෙස පවසා සිටියද මේවන තෙක් එම කාර්යය ඉටු වී නොමැති බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව බට සම්බන්ධයෙන් පරීක්ෂා කර සිදුකළ යුතු අළුත්වැඩියාවන් සිදුකරන ලෙසත් ආදාහනාගාරය ආසන්නේ

ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා කඩිනමින් ඇස්තමේන්තු සකස් කරන ලෙසත් මුරකුටියක් සකස් කිරීමට කටයුතු කරන ලෙසත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.14 කාණු අවහිරතා ඇති වන ස්ථාන පරීක්ෂා කිරීමේදී බොහෝ අවස්ථා වල ජලසම්පාදන මණ්ඩලය විසින් ජල සම්බන්ධතා ලබාදීම සඳහා ජලනල යෙදීමේදී කාණු අවහිර වන ලෙස ලබාදී ඇති බව නිරීක්ෂණය වන බව වැඩ අධිකාරී කේ.පී.මායාරත්න මහතා විසින් පවසා සිටින ලදී.එවන් ස්ථාන හඳුනාගනිමින් ජලසම්පාදන මණ්ඩලය දැනුවත් කර අදාළ අවහිරතා ඉවත්කර ගැනීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.15 කෝස්වේ කර්මාන්ත ශාලාව ඉදිරිපිට කාපට් මාර්ගය කොටු ආකාරයෙන් ස්ථාන 02 කින් කපා ඉවත් කර ඇති අතර එමඟින් එම මාර්ගයේ වාහන අනතුරු සිදුවිය හැකි බව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මේ පිළිබඳව ජාතික ජලසම්පාදන මණ්ඩලයෙන් විමසීම් කළ අතර ඔවුන් විසින් යම් අළුත්වැඩියාවක් සඳහා මෙම මාර්ග හානිය සිදුකර ඇති බව දැනගන්නට ලැබුණු බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව මේ සඳහා මුදල් ගෙවීමක් සභාව වෙත ගෙවා ඇත්නම් එය කඩිනමින් අළුත්වැඩියා කරන ලෙසත් නැතිනම් මෙම ස්ථානය සභාව විසින් කඩිනමින් පිළිසකර කර අදාළ වියදම ජල සම්පාදන මණ්ඩලයෙන් ලබාගැනීමට කටයුතු කරන ලෙසත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.16 ජලසම්බන්ධතා ලබාගැනීම සඳහා සභාවට ගෙවීම් සිදුකර ,කළා වූ මාර්ග හානි කිහිපයක් ඇති බැවින් ප්‍රිමික්ස් ලෝඩ් එකක් මිලදී ගනිමින් එම ස්ථානත් කඩතොලු සහිත අත්‍යාවශ්‍ය මාර්ගත් පිළිසකර කිරීම සිදුකරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.17 ආතර් වී දියෙස් මාවතේ හා ජනප්‍රිය මාවතේ අනවසර ඉදිකිරීම් සිදුකර ඇති අතර සමහර ඉදිකිරීම් පදික වෙළඳාමේ යෙදීමට අදින ලද සුදු ඉර ආසන්නයේ ස්ථිරව ඉදිකර ඇති බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව කඩිනමින් එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.18 මිනුවම්පිටිය සුසාන භූමියේ කතෝලික කොටසේ ඇති ගස්වල අතු දිරා ගොස් ඇති බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර එම දිරාගිය අතු කපාදැමීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.19 මිනුවම්පිටිය පාරේ සැලකිය යුතු කාලයක් තිස්සේ ගල් ගොඩගසා ඇති බව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මෙම ගල් අයිතිවන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මිනුවම්පිටිය මාර්ගයේ ආරම්භ කළ ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙතයි.නමුදු මෙම ව්‍යාපෘතිය තවකාලිකව නැවතී ඇති අතර නැවත ආරම්භ කරයි යන අදහසෙන් මේවන තෙක් එම ස්ථානයේ එම ගල් තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත එම ගල් ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා යැවීමට කටයුතු කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.20 ජනඋද්‍යානගම ඔප්පු ලබාදීම පිළිබඳව ගත්විට මේවන විට කළුතර විමර්ශණ නිළධාරිණියට ගැටළුවක් පැනනැගී තිබෙනවා,එහි සිටින එක් පුද්ගලයෙකු සතුව ඔප්පුවක් පැවතීම. එම නිසා මේ පිළිබඳවත් සොයා බලා මෙම ඔප්පු ලබාදීමේ කටයුත්ත කඩිනම් කිරීමට කටයුතු කල යුතු බව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මෙහිදී එක් පුද්ගලයෙකු සතුව පමණක් ඔප්පුවක් තිබිය නොහැකි බැවින් එම ඔප්පුවෙහි නීත්‍යානුකූලභාවය පිළිබඳව සොයා බලන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.21 එච්.සෝමපාල මහතා වෙත සභාව විසින් ඉඩම් කොටසක් ලබාදෙන ලෙස පෙර සභා තීරණයක් ගෙන ඇති අතර ඒ ඔස්සේ ඔහු විසින් මෙම ඉඩම් කොටස ඉල්ලා සිටින බවත් ඒ සඳහා ඔහු විසින් යම් කාලයකදී මුදල් ගෙවා ලබාගත් රිසිට් පතක් ඔහු සතුව ඇති බවත් ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.සභාව සතු ඉඩම් පෙර එසේ ලබාදුන්නද මේ අවස්ථාවේ ලබාදිය නොහැකි බැවින් ඒ පිළිබඳව නීති උපදෙස් ලබාගැනීමට කටයුතු කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.17 PUC/5/4/1/9/2022 වෑකඩ පෙර පාසලේ ඉහළ මහළ ඉදිකිරීම අදියර 1 (ජනෙල් දොරවල් සවිකිරීම) ලිපිගොනුවට අනුව, පසුගිය කර්මාන්ත කමිටුවේදී සාකච්ඡා කළ පරිදි හා 2022.04.07 මහා සභා තීරණය පරිදි සභාවේ පවතින ලී උපයෝගී කරගෙන දොර ජනෙල් සෑදීමේදී බැල්කනිය භාවිතා කිරීම අපහසු වන බැවින් ලී වලින් තල්ලු කරන ජනේල සෑදීම ප්‍රායෝගික නොවන බැවින් ඇලුමිනියම් යොදා ගෙන දොර ජනෙල් සෑදීම සඳහා සකස් කරන ලද රු 2,350,000.00 ක් වටිනා ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 2,350,000.00 ක ඇස්තමේන්තුව ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.18 PUC/5/4/3/31/2022 ටයිටස් ගුණතිලක මාවත කාණුව ඉදිකිරීම (ද සිල්වා මාවතේ සිට ටයිටස් වෙල් යාය දක්වා කොටස) ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කරන ලද රු 370,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 370,000.00 ක ඇස්තමේන්තුව,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.19 PUC/5/4/3/30/2022 අශෝක මාවත කාණුව ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කරන ලද රු 490,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 490,000.00 ක ඇස්තමේන්තුව, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

07. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

7.1 <u>කර්මාන්ත අංශය</u>

7.1.1 PUC/05/03/02-02/2022 ලිපි ගොනුවට අනුව 2022.10.19 සිට 2022.10.29 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද පෙට්‍රල් ඉන්ධන සඳහා එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.46,880.25 ක මුදල , මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත රු 46,880.25 ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.2 PUC/05/03/02-02/2022 ලිපි ගොනුවට අනුව 2022.10.05 සිට 2022.11.01 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද පෙට්‍රල් ඉන්ධන සඳහා Panadura Auto Services & Filling Station ආයතනය වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.32,344.46 ක මුදල , මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Panadura Auto Services & Filling Station ආයතනය වෙත රු 32,344.46 ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.3 PUC/05/03/02-01/2022 ලිපි ගොනුවට අනුව 2022.10.21 සිට 2022.10.30 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද ඩීසල් ඉන්ධන සඳහා එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.361,050.00 ක මුදල , මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත රු 361,050.00 ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.4 PUC/05/03/02-02/2022 ලිපි ගොනුවට අනුව 2022.10.14 සිට 2022.10.26 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද ඩීසල් ඉන්ධන සඳහා Panadura Auto Services & Filling Station ආයතනය වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.133,520.00 ක මුදල , මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Panadura Auto Services & Filling Station ආයතනය වෙත රු 133,520.00 ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.2 <u>මිශ්‍ර ආදායම් අංශය</u>

7.2.1 අපි පාණදුර ආයතනය විසින් සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා 2022.10.23 වන දින නගර ශාලාව වෙන්කර ඇත.විනෝද බදු මුදල ලෙස ප්‍රවේශපත්‍ර 380 ක් වෙනුවෙන් රු 141,250.00 ක මුදලක් ලදුපත් අංක I 56926 මඟින් 2022.10.21 වන දින අයකර ගෙන ඇත.නමුත් ප්‍රවේශ පත්‍ර 89 ක් පමණක් විකිණී ඇති බැවින් සහ ආදායම් පරීක්ෂක වාර්තාව අනුව සත්‍ය ලෙස අයවිය යුතු ටිකට්පත් විනෝද බදු මුදල රු 16,725.00 ක් වේ.එබැවින් වැඩිපුර අයකර ගෙන ඇති විනෝද බදු මුදල වන රු 124,525.00 ක් ආපසු ගෙවීමට මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 124,525.00 ක මුදල ආපසු ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.2.2 ශාන්ත ජෝන් බාලිකා විද්‍යාලයෙහි ගුරුවරියන් විසින් ළමුන්ගේ සහය සඳහා පිහිණුම් තටාකය නොමිලේ ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත.ඒ අනුව පිහිණුම් පුහුණුවීම් භාර ආචාරිණී සමඟ සාකච්ඡා කිරීමේදී සිකුරාදා දින ප.ව.4.00 සිට 5.00 දක්වා භාරත මයා යටතේ නොමිලේ පිහිණුම් පුහුණුවීම් ලබාදෙන ලෙසත් පසුව ළමුන් පුහුණුවීම් සිදුකරන අවස්ථාවේදී ඔවුන්ගේ සහයට තටාකය තුළට පැමිණෙන බවත් සඳහන් කරන ලදී.එම විද්‍යාලයෙහි පිහිණුම් පුහුණුවීම් සඳහා වරකට ළමුන් 50 කට ආසන්න ප්‍රමාණයක් පැමිණේ.ඒ අනුව එම ගුරුවරියන් සඳහා පිහිණුම් තටාකය නොමිලේ ලබාදීම පිළිබඳව මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අදාළ ගුරුවරියන්ට පුහුණුවීම සඳහා මසක කාලයක් නොමිලේ පිහිණුම් තටාකය භාවිතා කිරීමට අවසර ලබාදීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.2.3 පිහිණුම් පුහුණුකරුවන්ගේ ලියාපදිංචි ගාස්තුව අයකිරීම සම්බන්ධව පුහුණුකරුවන් සමඟ සාකච්ඡා කිරීමේදී වසරකට රු 5000/= ක් වැනි අඩු මුදලක් අයකරන ලෙස ඉල්ලීම් කරන ලදී.විගණනයේදීද මේ පිළිබඳව විමසුම් කර ඇති බැවින් මසකට රු 1000/= බැගින් එක් පුහුණුකරුවෙකුගෙන් අය කිරීමට තීරණය කර ඇත.තටාක නඩත්තු වියදම් අධික වී ඇති බැවින් සහ පුහුණුකරුවන්ගේ ආදායම් මාර්ගයක් ලෙස අප පිහිණුම් තටාකය උපකාර වන බැවින් වසරකට රු 5000- රු 7500 ක් අතර මුදලක් අයකිරීම යෝජනා කරන අතර ඒ සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පුහුණුකරුවන් විසින් පුහුණුවන්නන්ගෙන් ගාස්තුවක් අයකරන බැවින් සභාව වෙත ගෙවිය යුතු යැයි තීරණය කරන ලද රු 1000/= ක මුදල අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.2.4 පිහිණුම් තටාකයේ පවතින KICK BOARDS දිරාපත්ව පවතින බැවින් නව KICK BOARDS, 20 ක් සහ Pressure Gun 01 ක් ලබා දෙන ලෙස පිහිණුම් තටාක භාරකරු සහ පුහුණුකරුවන් විසින් ඉල්ලීම් කර ඇත.අදාළ භාණ්ඩ ලබාදීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

KICK BOARDS, 10 ක් මිලදී ගැනීම හා සභාවේ නඩත්තු අංශය සතු Pressure Gun එක අවශ්‍ය අවස්ථාවලදී භාවිතා කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.2.5 සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හී පිහිණුම් පුහුණුවීම් කටයුතු සිදුකිරීම සඳහා දුම්දු නදීශ මයා විසින් ඉල්ලුම් කර ඇති අතර ඒ අනුව පහත වේලාවන් ඉතිරිව පවතී.එම වේලාවන්ගෙන් තටාක දෙකම වෙන් වෙන් වශයෙන් සති අන්ත එක් දිනකට පැය 01 බැගින් ලබාදීම සුදුසු බව යෝජනා කරන අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

<u>වැඩිහිටි තටාකය</u>
සෙනසුරාදා - පෙ.ව.11.00 සිට ප.ව.2.00 දක්වා
ඉරිදා - පෙ.ව.11.00 සිට ප.ව.1.00 දක්වා
<u>ළමා තටාකය</u>
සෙනසුරාදා - පෙ.ව. 11.00 සිට ප.ව. 4.00 දක්වා
ඉරිදා - පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා

සෙනසුරාදා හා ඉරිදා යන දින දෙකින් එක් දිනක පැය 01 ක කාලයක් ලබාදීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.3 <u>ප්‍රජා සංවර්ධන අංශය</u>

7.3.1 2022 ජූලි,අගෝස්තු හා සැප්තැම්බර් මාසයන්හී ප්‍රධාන පුස්තකාලය වෙත හා ශාඛා පුස්තකාල හා කියවීම් ශාලා වෙත මිලදී ගත් පුවත් පත් වෙනුවෙන් පිළිවෙලින් සභා ආවරණ අනුමැතියට යටත්ව පුවත්පත් අලෙවි නියෝජිත එස්.ඩබ්.ජී.එම්.සිල්වා මයා වෙත ගෙවන ලද රු 47,280.00, රු 46,840.00 හා රු 45,280.00 ක මුදල,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පුස්තකාලය/කියවීම් ශාලාව	2022 ජූලි	2022 අගෝස්තු	2022 සැප්තැම්බර්
ප්‍රධාන පුස්තකාලය	රු 16,530.00	රු 16,690.00	රු 16,130.00
මෝදරවිල පුස්තකාලය	රු 5,100.00	රු 5,000.00	රු 4,830.00
උඩහමුල්ල පුස්තකාලය	රු 5,500.00	රු 5,300.00	රු 5,200.00
තන්තිරිමුල්ල පුස්තකාලය	_	_	_
කවිරාජ මාවත පුස්තකාලය	රු 5,600.00	රු 5,750.00	රු 5,530.00
සාගර මාවත පුස්තකාලය	රු 5,250.00	රු 5,000.00	රු 4,830.00
තුඩුව පුස්තකාලය	රු 4,100.00	රු 4,100.00	රු 3,930.00
සොලමන් මාවත පුස්තකාලය	රු 5,200.00	රු 5,000.00	රු 4,830.00
	රු 47,280.00	**රු 46,840.00**	**රු 45,280.00**

එස්.ඩබ්.ජී.එම්.සිල්වා මයා වෙත ගෙවන ලද රු 47,280.00, රු 46,840.00 හා රු 45,280.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.4 නව තාවකාලික කඩ කාමර වල මාසික ගාස්තු ගෙවීම පිළිබඳව ලබාදී ඇති වාර්තාව නිරීක්ෂණය කළ මුදල් කමිටුව විසින් මාස 03 කට වඩා හිඟ කඩකුලී ගෙවීමට ඇති කඩ කාමර ,නැවත සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.5 කේ පෝරම බෙදා දීමේ කටයුතු මේවන විට ආරම්භ වී ඇති බැවින් ඒවා බෙදා දීමේදී සභා සීමාවේ තිබෙන වරිපනම් බදු අය නොවන ස්ථාන හඳුනා ගනිමින් ඒ පිළිබඳව ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.6 සභාව සතු එල් කඩ වලින් කොටසක් පමණක් ටෙන්ඩර් කිරීමට කටයුතු කරන අතර එල් කඩ සියල්ලම ටෙන්ඩර් කළ යුතු බවත් පොදු වෙළඳ පොළෙහි පන්සල ආසන්නයේ දැනට හිස්වැසුම් වෙළඳාමේ යෙදෙන කඩ කාමරයද සභාව සතු දේපලක් බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව එල් කඩ සියල්ලම වාර්ෂිකව ටෙන්ඩර් කිරීමට කටයුතු කිරීමත් අදාළ හිස්වැසුම් වෙළඳාමේ යෙදෙන කඩ කාමරය පිළිබඳව ලියවිලි ගෙන්වා ගනිමින් පරීක්ෂා කිරීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.7 පාණදුර, ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ඔවුන් සමඟද ගණුදෙනු කරන ලෙස ලිපියක් යොමුකර ඇති බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව ස්ථාවර තැන්පතු සඳහා ගෙවනු ලබන පොළී මුදල් පිළිබඳව විස්තර අදාළ බැංකුවෙන් ලබාගන්නා ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.8 ව්‍යාපෘතීන් සඳහා ඇස්තමේන්තු සකස් කළද මෙම ව්‍යාපෘතීන් සඳහා වැය කිරීමට ප්‍රතිපාදන තිබේද යන්න ගැටළුවක් ඇති බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව වසරේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කළ මුදලින් මේවන විට ව්‍යාපෘතීන් සඳහා යොදවා ඇති මුදලත් ඉතිරි ප්‍රතිපාදන පිළිබඳවත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

2022.11.17 මුදල් කමිටු වාර්තාවේ කරුණු අංක 7.2.3 යටතේ පිහිණුම් තටාකයේ පුහුණුකරුවන්ගෙන් අයකරන ලද ගාස්තුව රු1000.00 ක් ලෙස තීරණය කර ඇති බව සඳහන් කර තිබුණද එම අයකිරීම සිදුකරනු ලබන්නේ මාසිකවද වාර්ෂිකවද යන්න සඳහන්ව නැහැ.පෙර සභා තීරණයක් ගෙන තිබෙනවා මාසිකව රු 1000.00 ක මුදලක් අයකර ගැනීමට.ඒ අනුව මෙම තීරණය සංශෝධනය කළ යුතු බව පවසා සිටින ලදී.

<u>සංශෝධන 01</u>

7.2.3 පිහිණුම් පුහුණුකරුවන්ගේ ලියාපදිංචි ගාස්තුව අයකිරීම සම්බන්ධව පුහුණුකරුවන් සමඟ සාකච්ඡා කිරීමේදී වසරකට රු 5000/= ක් වැනි අඩු මුදලක් අයකරන ලෙස ඉල්ලීම් කරන ලදී.විගණනයේදීද මේ පිළිබඳව විමසුම් කර ඇති බැවින් මසකට රු 1000/= බැගින් එක් පුහුණුකරුවෙකුගෙන් අය කිරීමට තීරණය කර ඇත.තටාක නඩත්තු වියදම් අධික වී ඇති බැවින් සහ පුහුණුකරුවන්ගේ ආදායම් මාර්ගයක් ලෙස අප පිහිණුම් තටාකය උපකාර වන බැවින්

වසරකට රු 5000- රු 7500 ක් අතර මුදලක් අයකිරීම යෝජනා කරන අතර ඒ සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පුහුණුකරුවන් විසින් පුහුණුවන්නන්ගෙන් ගාස්තුවක් අයකරන බැවින් සභාව වෙත ගෙවිය යුතු යැයි තීරණය කරන ලද මසකට රු 1000/= ක මුදලක් අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.11.17 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ ,අදාළ සංශෝධන වලට යටත්ව අනුමත කිරීමට තීරණය කරන ලදී.

(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම -

(උ.1) 2022.10.26 මහජන පෙත්සම් කාරක සභා වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

සාගර මාවතේ පොදු ළිඳ හා ඉඩම සම්බන්ධයෙන් පසුගිය මහජන පෙත්සම් කාරක සභාවේදී දෙපාර්ශවයක් ගෙන්වා සාකච්ඡා කර තිබෙනවා.එහිදී පාර්ශවයන් දෙක අවස්ථා දෙකකදී කමිටු කාමරය වෙත කැඳවා ඇතත් එක් කණ්ඩායමක් කැඳවූ අවස්ථාවේදී කමිටුවේ සිටි නිළධාරියෙකු හෝ සහික මහතෙකු අදාළ අදහස් දැක්වීම් සියල්ල අනෙක් පාර්ශවයට දුරකථනය ඔස්සේ ඇසීමට සලස්වා තිබෙනවා.මෙම ප්‍රකාශය සිදුකරන්නේ ඉතාමත් වගකීමකින් යුක්තව.එමනිසා ඉදිරියේදී මෙම කමිටුව පවත්වන අවස්ථාවේදී දුරකථන ක්‍රියාකාරී තත්ත්වයේ තබාගැනීම නතර කළ යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙවන් දේ සම්බන්ධයෙන් නීති පැනවීමක් සිදු නොකර සියළු දෙනාගේ එකඟතාවය මත යම් ක්‍රමවේදයක් සකස් කළ හැකි බව පවසා සිටින ලදී.

(උ.2) 2022.11.11 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.3) 2022.11.11 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

කර්මාන්ත කමිටු වාර්තාවේ 02 වන කරුණෙහි සඳහන් වෙනවා ප්‍රධාන කාර්යාලයේ ඇති සීසීටීවී කැමරා පද්ධතියේ දෝශ සකස් කිරීම වෙනුවෙන් රු 13,440.00 ක මුදලක් ඇපෝජි

ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම වෙත ගෙවීමක්.මෙහිදී මෙම අළුත්වැඩියාව සිදුකර ඇත්නම් එම අළුත්වැඩියාව කුමක්ද යන්න පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙහිදී අළුත්වැඩියාවක් මේවන තෙක් සිදුකර නොමැති අතර පවතින දෝෂ ,නිරීක්ෂණය සඳහා අදාළ ආයතනය විසින් සභාව වෙත පැමිණීම වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මිලගණන සඳහා ගෙවීම පමණක් මෙහි සඳහන් වන බව පවසා සිටින ලදී.

(උ.4) 2022.11.17 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම -

(ඌ.1) 2022 ඔක්තෝබර් මස ලැබීම් ගෙවීම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.2) 2022 ඔක්තෝබර් මස වරිපනම් අයකිරීම සම්බන්ධ මාසික ප්‍රගති වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

මුදල් කමිටුවේදී වරිපනම් ගාස්තු සංශෝධනය කිරීමේදී හිඟ අයකිරීමට යටත්ව සිදු කරන අතර එම හිඟ අයකිරීම පිළිබඳ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස ඉල්ලීම් සිදුකළද එය ලබාදෙන ලද්දේ එක් මසක් පමණි.එමනිසා එම වාර්තාව අඛණ්ඩව ලබාදීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඌ.3) 2022.10.31 දිනට හිඟ ආදායම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු සභාපතිතුමා</u>

සංවර්ධනය නොකළ ඉඩම් මත අයකළ යුතු බදු අයකිරීමක් සිදු නොවන අතර එම බදු අයකරමින් සභාවට ආදායමක් ගැනීමට ආදායම් පරීක්ෂක මහතුන් කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

(එ) අංශ ප්‍රගතිය සලකා බැලීම -

(එ.1) 2022 ඔක්තෝබර් මස ආදාහනාගාරයේ ආදායම් වියදම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.2) 2022.10.01 සිට 2022.10.31 දක්වා සභාව විසින් කසළ කළමනාකරණයේදී ,කසළ අවසන් බැහැර කිරීම පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.3) 2022 ඔක්තෝබර් මාසයේ ඩෙංගු මර්දන ව්‍යාපෘති සේවකයින්, සේවයේ යෙද වූ ආකාරය පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.4) බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමියගේ උපදෙස් පරිදි 2020.02.10 වන දින බඳවා ගන්නා ලද ඩෙංගු මර්දන ව්‍යාපෘති සේවකයින් 2022 ඔක්තෝබර් මාසයේ සේවයේ යෙද වූ ආකාරය පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.5) 2022 ඔක්තෝබර් මස නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.6) 2022 ඔක්තෝබර් මස පෙර පාසල් මාසික ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.7) 2022 ඔක්තෝබර් මස පුස්තකාල ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

පුස්තකාල ප්‍රගතිය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීමේදී නැණසලේ ආදායමද ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ) වෙනත් කරුණු

(ඒ.1) <u>ගරු සභාපතිතුමා</u>

(ඒ.1.1) පසුගිය විගණන කළමනාකරණ කමිටුවේදී විගණන නිළධාරී මහතා පවසා සිටියා වෙනත් සභාවන් හී අතිරික්ත ලෙස වාහන පවතින බව.එහිදී අප සභාව වෙත අවශ්‍යව පවතින වාහන එම ආයතනවලින් ලබාගැනීමට ඉල්ලීම් කරන ලෙස උපදෙස් දුන්නද එය මේවන තෙක් ඉටු වී නොමැති බැවින් කඩිනමින් එම ලිපි සකස් කර යැවීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.1.2) ඉදිරියේදී වර්ෂා කාලය පටන් ගන්නා අතර පසුගිය වර්ෂා අවස්ථාවලදී දුටු සිද්ධියක් තමයි ජයතිලක මාවතේ ජලය සැලකිය යුතු මට්ටමකට රැඳී තිබෙනවා.පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශය විසින් නගර සභාව වෙත ලක්ෂ 60 ක ප්‍රතිපාදන ලබාදෙන බව පවසා සිටියා.එමනිසා වැසි ජලය පිළිබඳව පවතින ගැටළුවට විසඳුමක් වශයෙන් මෙම මුදල් වලින් ජයතිලක මාවතේ කාණු පද්ධතිය පළල් කර එයට උඩින් වාහන ගමන් කළ හැකි පරිදි සකස් කිරීමට අදහසක් පවතිනවා යැයි පවසා සිටින ලදී.එහිදී කාණුව බැඳීමකින් තොරව පෙර නිමවුම් කොන්ක්‍රීට් පෙට්ටි මඟින් මෙය සකස් කිරීම කළ හැකියි.එමෙන්ම තැපැල් කාර්යාලය අසල සිට

ලංගම බස් නැවතුම් පොළ දක්වා ඇති කාණුව මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්වී පිරිසිදු කිරීමටද කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

හොරණ පාරේ කාණු පද්ධතිය මාර්ග සංවර්ධන අධිකාරියෙන් පිරිසිදු කර එම පස් මාර්ගයන්හි ගොඩගසා ඇති අතර වර්ෂා අවස්ථාවන් වලදී එම පස් නැවත කාණු වෙතම යොමු වන බැවින් ඒවා එම ආයතනය විසින් ඉවත් කිරීමක් සිදුනොකරන්නේ නම් සභාව මැදිහත් වී ඉවත් කර එම පස් සභාව වෙත රැගෙන ඒමට කටයුතු කරන්න යැයි පවසා සිටින ලදී.

(ඒ.1.3) නගරයේ අයාලේ යන ගවයන් ඉවත් කිරීමට සභාව විසින් කිසිදු පියවරක් නොගන්නා බව කියමින් ජනතාව විසින් පැමිණිලි ඉදිරිපත් කළා.ඒ අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා හා සභාවේ සේවක මහතුන් එකතු වී ගවයන් ඇල්ලීමට මහත් වෙහෙසක් දරමින් සිටින අතර මේවන විට එම ගවයන් අල්ලන අවස්ථාවේ සිදුවූ හදිසි අනතුරකින් සේවක මහතෙකු කොදුඇට පේළියට සිදු වූ හානියක් හේතුවෙන් රෝහල්ගතව සිටිනවා යැයි පවසා සිටින ලදී.ඉදිරියේදී මෙවන් අනතුරක් සිදුවූ විට ගත යුතු ක්‍රියාමාර්ග හා අදාළ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතු නිළධාරීන් කවුද යන්න නිසි ලෙස උපදෙස් පත්‍රිකාවක් සකසා තැබීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

අයාලේ යන ගවයන් ඇල්ලීම සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට හා එම සේවක මහතුන්ට ස්තූතිය පුදකර සිටිනවා.එම කටයුත්තේදී මේවන විට අනතුරට ලක්වී සිටින සේවක මහතුන්ට ලබාදිය යුතු නිවාඩුද අනෙකුත් සියළු දේද සභාව වෙනුවෙන් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.එමෙන්ම නගරයේ සැරිසරන සුනඛයින් සඳහා ජලභීතිකා එන්නත්කරණ වැඩසටහනක් පසුගිය දිනක සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් හා පාණදුර සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ සේවක මහතුන්ද මැදිහත් වී සිදුකර තිබෙනවා.ඒ සඳහාද ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

(ඒ.2) <u>**ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය**</u>

(ඒ.2.1) එකේ කණුව අසල කෙසෙල් වෙළඳාමේ යෙදීමට අවසර ලබාදී තිබෙනවාද යන්න දැනගැනීමට කැමති අතර මේවන විට එම පාර්ශවය ටිකෙන් ටික පුස්තකාල භූමිය තුළට පැමිණීමක් දක්නට ලැබෙන බැවින් ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගන්නා ලෙස පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

ඉස්සර ගරු සභික මහතෙකුගේ ඉල්ලීමකට අනුව බදු මුදලක් ගෙවීමේ පදනම මත උපාසිකාරාමයේ තාප්පය අසලින් ලෑල්ලක් තබාගෙන විකිණීමට අවසර ලබාදී තිබෙනවා.නමුදු කිසිදු ඉදිකිරීමක් සිදුකිරීමට අවසර ලබාදීමක් සිදුකර නැහැ.පුස්තකාල ඉඩම තුළට පැමිණීමට යොමු වනවා නම් එම වැට මායිමට ස්ථිරව කම්බි වැටක් ගැසීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.2.2) සභාවේ නිළධාරීන්ට හා සේවක මහත්ම මහත්මීන්ට පසුගිය දිනවල ලබාදුන් එම පුහුණු අවස්ථාව වෙනුවෙන් ලේකම්තුමිය ඇතුළු එම සංවිධාන මණ්ඩලයට ස්තූතිවන්ත වන බව පවසා සිටින ලදී.

(ඒ.2.3) මෙම පුහුණු වැඩසටහන් සඳහා උපාලි සුරවීර මහතා විසින් නොමිලේ කැනපි ලබාදුන් අතර ඒ සඳහා එතුමාට ස්තූති ලිපියක් නිකුත් කරන ලෙස පවසා සිටින ලදී.එමෙන්ම සභාවේ විවිධ

වැඩසටහන් සඳහා ද කැනපි අවශ්‍ය වන බැවින් කැනපි මිලදී ගැනීමට කටයුතු කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

(ඒ.3) <u>ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතා</u>

(ඒ.3.1) සභාවේ සිටින නිළධාරියෙකු සභාවේ තේක්ක කඳක් ,ඉරීමට ලී මඩුවකට ගෙන ගොස් ඇති අතර ලී මඩුවෙන් ලබාගත් තොරතුරු අනුව අදාළ කඳෙන් කියුබ් අඩි 56 ක් තමයි ලබාගෙන තිබෙන්නේ.මෙම ඉරන ලද ලී වලින් කොටසක් අදාළ නිළධාරියා විසින් රැගෙන ගොස් තිබෙනවා.ඒ බව සීසීටීවී කැමරා වල සටහන්ව තිබෙනවා.එමෙන්ම කියුබික් අඩියකින් රු 50 ක්ද තබාගනිමින් මුදල්ද වංචා කර තිබෙනවා.මේ බව සභාවේ නිළධාරිණියක දැනුවත් කළද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ.මීට පෙරද සභාව විසින් කපන ලද කොස් කඳක් සභාව වෙත රැගෙන ඒමකින් තොරව විකිණීමට කටයුතු කර තිබෙනවා.ඒ පිළිබඳවද සියළු තොරතුරු සභාව වෙත ලබාදුන්නද ඒ සම්බන්ධයෙන්ද කිසිදු පියවරක් ගත්තේ නැහැ.එමනිසා මෙවන් වංචා පිළිබඳව දැඩි ක්‍රියාමාර්ග ගන්නා ලෙස පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

තේක්ක කඳෙහි ඉහළ කොටස තමයි උළුවහු ,දොර ජනෙල් සඳහා යොදා ගත්තේ.එහි මුල් කොටසට කුමක්ද වුණේ කියා සොයා බැලීමද සිදුකළ යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම නිළධාරියා සම්බන්ධයෙන් මීට පෙරද සේවකයින් සමඟ මත්පැන් පානය කළ බවට චෝදනාවක් පැවති අතර ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරන ලෙස උපදෙස් දුන්නා.නමුදු ඒ සඳහා කිසිදු පියවරක් මේවන තෙක් ගෙන නැහැ.කොස් ගස සම්බන්ධයෙනුත් ඒ ආකාරයෙන්ම නිසි විමර්ශනයක් සිදුකළේ නැහැ.එමනිසා මෙම නිළධාරියා සම්බන්ධයෙන් පවතින සියළු චෝදනා සම්බන්ධයෙන් නිසි විමර්ශන කඩිනමින් සිදුකර විනය ක්‍රියාමාර්ග ගැනීම හෝ සේවය අත්හිටුවීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.4) <u>ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය</u>

(ඒ.4.1) ෆොන්සේකා පාරේ සීලවතී ආරාමය අසළ මාර්ග කොටස සංවර්ධනය කිරීමට කටයුතු කළ අතර ඒ පිළිබඳව ගරු සභාපතිතුමාටත්, ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතාටත් අදාල සේවක මහතුන්ටත් ස්තුතිය පුදකරන බව පවසා සිටින ලදී.

(ඒ.5) <u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

(ඒ.5.1) 2022.11.03 මහා සභා වාර්තාවේ ඇතුළත් සෞඛ්‍ය කමිටු තීරණ 5.2 හි සඳහන් වෙනවා GFC මැෂිනර් පුද්ගලික සමාගම වෙත ලෝඩ් 22 ක් යවන ලද බවත් ඒ සඳහා රු 758,975.00 ක් ගෙවූ බවත්.නමුදු සභා වාර්තාවේ ඇතුළත් මුදල් කමිටු තීරණ අංක 5.2 හි සඳහන් වෙනවා GFC Machinery (Pvt) Ltd ආයතනය වෙත 2022 අගෝස්තු මස කසල ලෝඩ් 32 ක් සඳහා රු. 1,104,000/- ක මුදලක් ගෙවූ බව.මෙහිදී මාසය එකම වුවද ගණනයන්හී යම් වෙනසක් පවතින බැවින් ඒ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් ලබාගත හැකිද යන්න විමසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මහජන සෞඛ්‍ය පරීක්ෂතුමා පවසා සිටින ආකාරයට සෞඛ්‍ය කමිටුවට ඉදිරිපත් කරන ලද වගුවෙහි ලෝඩ් ගණන ලෝඩ් **32** ක් විය යුතුයි.එමනිසා මෙම තොරතුරු නිවැරදිව සංශෝධනය කර මීළඟ සෞඛ්‍ය කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.5.2) 2022.11.03 මහා සභා වාර්තාවේ ඇතුළත්, 2022.10.13 කර්මාන්ත කමිටු තීරණ 11.4 හී සඳහන් වෙනවා කුරුප්පුමුල්ල පහළ ඉඩම් කැල්ලක පදිංචි සෝමපාල පෙරේරා මහතා විසින් ඉල්ලා සිටින ඉඩම් කැබැල්ල ඔහුට ලබාදීමට හැකිද යන්න පවතින නීති සලකා බලමින් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු ඉටු කරන ලෙස.මෙම පුද්ගලයා විසින් වරින් වර මේ පිළිබඳව විමසීම් කරන බැවින් සභාව විසින් මේ සඳහා කටයුතු කරමින් පවතින යැයි සඳහන් කර හෝ එතුමා වෙත ලිඛිතව දැනුවත් කිරීම සිදුකරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.3) පාණදුරේ දේශපාලන ඉතිහාසයේ පළමු වරට දැවැන්ත වේදිකාවක දැවන්ත රැළියක් පසුගිය දිනක පැවැත්වූ අතර ඒ සඳහා සහයෝගය දුන් නගර ශාලාව භාරව සිටින ජනක මහතාටත් ගබඩාව භාරව සිටින බිමල් මහතාටත් ක්‍රීඩාපිටිය භාරව සිටින නාමල් මහතාටත් පුස්තකාලාධිපතිණියටත් ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

(ඒ.5.4) මෙම සභාවට පත්වූ අවස්ථාවේදීම තමා විසින් ඉල්ලා සිටියා මෙම සභාවේ නිළධාරීන් ,සේවක මහතුන් හා සභිකයින් අතර සම්බන්ධතාවයක් ඇති කළ යුතුයි කියා.එම ඉල්ලීම 2022 වර්ෂයේ පසුගිය මාසයේ පළමු වතාවට සිදුවූ අතර සභාවේ නිළධාරීන් සමඟ සභිකයින් සම්බන්ධ වී වැඩසටහනක් පැවැත්වූවා.එහිදී දේශනය ලබාදුන්නේ මහාචාර්ය මංගල දිසානායක මහතා විසින්.ඒ අවස්ථාවේදී තමයි පාහියන් නීතිය පිළිබඳව තමාට මුල්වරට දැන ගැනීමට ලැබුණේ.එමෙන්ම 2022.12.07 වන පෝය දා සභාවේ අනෙකුත් සේවක මහත්ම මහත්මීන් හා සභිකයින් සඳහා වැඩසටහනක් සංවිධානය කර තිබුණා.ඒ අවස්ථාවේ එම සේවක මහත්ම මහත්මීන් ලද සතුට කියා නිමකළ නොහැකියි.එම සේවකයින් පවසා සිටියා වසර ගණනාවකින් මෙවන් සතුටක් ලැබුණේ එදින බව.මෙසේ මෙම වැඩසටහන් දෙක සංවිධානය කිරීම පිළිබඳව ලේකම්තුමිය ඇතුළු එම සංවිධායක මණ්ඩලයට ස්තූතිය පුදකරනු ලබනවා.මෙම වැඩසටහන් සඳහා සභිකයින් වශයෙන් සම්බන්ධ වූයේ සීමිත පිරිසක්.ගරු සභාපතිතුමා මුල් වැඩසටහනේදී දවසම රැඳී සිටියා දෙවැනි වැඩසටහන සඳහා සහභාගී වීමට නොහැකි වුණේ අනතුරටපත් සේවකයෙක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට ගිය බැවින්.එබැවින් මෙවන් වැඩසටහන් සඳහා සභිකයින්ට හැකි අයුරින් සම්බන්ධවන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.5) පෝයා දින පැවති වැඩසටහනේදී අවසානයේ සේවක මහත්ම මහත්මීන්හට ගීත ගායනා කර සතුටු වීමට අවස්ථාව ලබාදුන් අතර එහිදී එම ශබ්ද විකාශන පද්ධතියේ යම් දෝෂයක් හටගන්නා ලදී.එහිදී සේවක මහතුන් හට ඒ අවස්ථාව නගර ශාලාව වෙත රැගෙන ගොස් ලබාදීමට තීරණය කළද ඒ අවස්ථාවේ නගර ශාලාව වසා දමා නගර ශාලාවේ සේවක මහතා වෙනත් ස්ථානයක රාජකාරියක් සඳහා ගොස් තිබුණා.මොහු එදින මෙම වැඩසටහන සඳහා සම්බන්ධ වී සිටිය යුතු වුවද ඔහු එහි සිටියේ නැහැ. රැඳී සිටියේ නගර ශාලා භාරකරු ලෙස කටයුතු කරන ජනක මහතා පමණයි.පසුව කෙසේ හෝ පරිපාලන නිළධාරීතුමිය හා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා මැදිහත් වී තමයි ඔහුව ගෙන්වා ගත්තේ.ඔහු පැමිණ ඉන්පසු යොදන ලද්දේත් අදාළ සේවක මහතුන්ට සතුටු වීමට හැකි ගීත නොවෙයි.ඒ අවස්ථාවේ සංවිධායක මණ්ඩලය ඒ සඳහා මැදිහත් වී එම ගැටළුව විසඳුවා.මෙම සේවක මහතා සම්බන්ධයෙන් මීට පෙරත් මෙවන් ආකාරයේ ගැටළු පැවති බැවින් ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.6) නගර ශාලාවේ අබලන්ව පැවති දොර ජනෙල් අළුත්වැඩියා කිරීමට කටයුතු කර තිබෙන අතර එය ඉතා අගයන බවත් මල් ප්‍රදර්ශණය පවත්වන පැත්තේ පවතින කාමරයේ ජනේලයද ලී පටි ගසා ඇති බැවින් හැකියාවක් ඇත්නම් එයද සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.7) කොන්ත්‍රාත් පදනම මත වැඩ අධිකාරී තනතුරේ සේවය කළ මායාරත්න මහතා මෙම සභාවෙහි සේවය කළ මාස 11 ක කාලසීමාව තුළ සභාව වෙනුවෙන් ඉමහත් සේවයක් ඉටු කළා.මේවන

විට එතුමාගේ කාලසීමාව අවසන් වී ඇති බැවින් සේවය නතර වී තිබෙනවා.නමුදු හැකියාවක් ඇත්නම් මෙම වසරේ දෙසැම්බර් 31 වෙනිදා දක්වා හෝ එතුමාගේ සේවය ලබාගැනීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.5.8) මෙම සභා වාරය කවදා අවසන් වේවිද කියා යම් සැකයක් පවතින බැවින් මෙම සභා වාරය අවසන් වීමට පෙර සභාව වෙනුවෙන් ඉමහත් කැපකිරීම් කරමින් සේවය ලබාදෙන්නාවූ කුසුම්සිරි මහතාගේ තනතුර හා වැටුප සම්බන්ධයෙන් පවතින ගැටළුව නිරවුල් කර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.9) වැකඩ පුස්තකාලය හා පෙරපාසල පසුගිය දිනක 04 වෙනි වරටත් සොරු බිඳ පුස්තකාලයේ පැවති විදුලි පංකා ගලවා ගෙන යාමට කටයුතු කර තිබෙනවා.මෙම පුස්තකාලයේ ඇති ජනේලයක කොටසක් කපා තහඩුවක් දමා තිබෙනවා පත්තර දැමීම සඳහා.ඒ ඔස්සේ ජනේලය විවෘත කර ගෙන ගොස් තමයි මේ අවස්ථාවේ සොරකම සිදු කර තිබෙන්නේ.මේ පිළිබඳව පොලීසිය වෙත පැමිණිල්ලක්ද සිදුකළා.එමනිසා මෙම ජනෙල් සඳහා ග්‍රිල් ගැසීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.10) වැකඩ පුස්තකාලයේ පොත් 3000 සම්පූර්ණ කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් පොත් ලබාදුන්නා.ඒ පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තූතිය පුදකරන අතරම මෙම පුස්තකාලය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.11) මෙම වසරේ සභිකයින් හට තම කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ 10 බැගින් ප්‍රතිපාදන වෙන්කළා.තමා වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදන මේවන තෙක් ලබානොගත් බැවින් එම ප්‍රතිපාදන මඟින් වැකඩ පෙර පාසලේ ඉහළ මහලේ ජනෙල් දොරවල් සවිකර අවසන් කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

(ඒ.5.12) වැකඩ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ කටයුතු කල්යෑමක් සිදු වෙනවා නම් එම පිටිය වටා ඇති මේ වන විට තැනින් තැන ගැලවීමට ලක්වී ඇති කම්බි වැට සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.13) වැකඩ ජනඋදාන ගම නිවාසලාභීන්ට ඔප්පු ලබාදීමේ කටයුත්ත ඉටු කර ගත නොහැකිව ලබන වසරට වසර 30 ක් වෙනවා.එමනිසා මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා මැදිහත් වී මෙය අවසන් කර මෙම සභා වාරයේදීම මෙම නිවැසියන්ට ඔප්පු ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.5.14) සුමනසිර මාවතේ නිවැසියන් විසින් ලිපියක් සභාව වෙත යොමු කර තිබෙනවා එම ප්‍රදේශයේ ඩෙංගු රෝගියෙකු වාර්තා වී ඇති බැවින් ධූමායන කටයුතු සිදුකර දෙන ලෙස.නමුදු මේ පිළිබඳව විමසා බැලීමේදී දැන ගැනීමට ලැබුණේ මෙම ධූමායන කටයුතු සිදුකිරීම සඳහා යොදා ගන්නා ඖෂධ, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේත් සභාවෙත් නොමැති බව.එමනිසා මේ පිළිබඳව සොයා බලා යම් පියවරක් ගැනීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.5.15)ආණ්ඩුව මේ අවස්ථාවේ මොනවා පවසා සිටියත් ආර්ථික උද්දමනය අතින් ලෝකයේ රටවල් අතරින් අපේ රට 86 ක් සහිතව 6 වෙනි ස්ථානයේ පවතින්නේ.නමුදු අපේ මහබැංකුව පවසා සිටින්නේ කිසිදු ගැටළුවක් නොමැති බවයි. මේවන විට අපේ රටේ ජනතාවගෙන් ලක්ෂ 62 ක් ආර්ථික අර්බුදයෙන් පීඩා විඳින බව ලංකාදීප පුවත්පතේ වාර්තාවක සඳහන් වෙනවා.එමනිසා මේවන විට රටේ ජනාධිපතිතුමා වශයෙන් පත්වී සිටින්නේ එක්සත් ජාතික පක්ෂයේ නායකයා බැවින් මෙම සභාව නියෝජනය කරන ගරු සභාපතිතුමා ඇතුළු එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයින්ගෙන් ඉල්ලා සිටිනවා ලබන වසරේ පෙබරවාරි මස පාර්ලිමේන්තුව විසුරුවා

හරිමින් මහා මැතිවරණයක් පැවැත්වීම සඳහා පක්ෂ නායකයාට යම් බැලපෑමක් සිදුකරන ලෙස ඉල්ලා සිටින ලෙස පවසා සිටින ලදී.

(ඒ.6) <u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

(ඒ.6.1) පසුගිය දින සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් පැවැත්වූ වැඩසටහනේදී සේවකයින් විශාල වශයෙන් සතුටු වුණා.එදින එම වැඩසටහන සංවිධානය කළ ආයතන අංශයේ කණ්ඩායම සේවකයින්ට කිසිදු බේදයක් නොමැතිම සෑම දේම ලබාදෙමින් කැපවීමකින් කටයුතු කළ අතර අදාළ වැඩසටහන ඉතා සාර්ථකව ඉටු කිරීම සම්බන්ධයෙන් ලේකම්තුමියටත් එම සංවිධාන මණ්ඩලයටත් ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

(ඒ.6.2) වෙරළ තීරයේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා රාජ්‍ය නොවන සංවිධානයක් මගින් සේවකයින් ලබාදීමක් සිදුවූ අතර එම සේවකයින් විසින් පැය 02 ක් රාජකාරිය ඉටු කළඳ කසල නිසි අයුරින් ඉවත් කරමින් වෙරළ තීරය පිරිසිදුව තබාගැනීමට කටයුතු කරනවා.ඒ සම්බන්ධයෙන් ජනතාවගේ ප්‍රසාදයද ලැබී තිබෙනවා.එමනිසා එම කටයුතු සංවිධානය කළ සභාවේ නිළධාරීන්ටත් ජෙරම් මහතාටත් ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.එමෙන්ම එම සේවකයින්ට ලබාදීම සඳහා රේක්ක තමා සතුව පවතින අතර ඒ සඳහා යකඩ බටයක් සභාව මගින් පැස්සුම් කර ගැනීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.6.3) වෙරළ තීරය සඳහා ජනතාව සෑහෙන ප්‍රමාණයක් පැමිණෙන බැවින් වෙරළ තීරයේ ජනතාවගේ භාවිතය සඳහා ජල කරාම කිහිපයක් ස්ථාන ගත කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.7) <u>ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා</u>

(ඒ.7.1) නල්ලූරුවේ සංඝානන්ද මාවත,සොයිසා පාර දින 04 ක් තිස්සේ අඳුරේ පැවතුණේ.අවස්ථා කිහිපයකදී මේදේ සිදුවුණා.එමනිසා මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.7.2) සභාවේ නිළධාරීන්ට හා සේවකයින්ට පැවැත්වූ එම පුහුණු වැඩසටහන් අවස්ථා දෙකහිදීම අවසානය වන තෙක් සම්බන්ධ වී සිටියා.එම අවස්ථා දෙකේ දීම සහෝදරත්වයෙන් සියළු දෙනා එක්ව කටයුතු කළා සතුටු වුණා.එමනිසා එම අවස්ථාව ලබාදීම වෙනුවෙන් ගරු සභාපතිතුමාටත් අදාළ කටයුතු සංවිධානය කිරීම වෙනුවෙන් ලේකම්තුමියටත් එම සංවිධායක මණ්ඩලයටත් ස්තූතිය පුදකරන අතර ඉදිරි වර්ෂයේදීත් මෙවන් වැඩසටහනක් ඉටු කිරීමට අවස්ථාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

(ඒ.8) <u>ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා</u>

(ඒ.8.1) පාණදුර පොදු වෙළඳ පොළ ඉදිකරන තෙක් සකස් කළ තාවකාලික කඩ කාමරවල මාළු වෙළඳාමේ යෙදෙන වෙළෙන්දන්ට ජලය නොමැති වීම ගැටළුවක් බව ඔවුන් විසින් පවසා සිටිනවා.එමනිසා යම් ගාස්තුවක් අයකර ගැනීමට යටත්ව හෝ එම කඩ කාමර ආසන්නයට ජල කරාමයක් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.8.2) ආතර් වී දියෙස් මාවතේ හා කෙලින් වීදියේ කාණු වල බෝතල් හා පොලිතීන් රැදී තිබෙනවා.මේවා මත ජලය රැදී ඩෙංගු බෝවීමේ තර්ජනයක් පවතින බැවින් මෙම කාණු මසකට වරක් හෝ පිරිසිදු කිරීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම කාණු පරීක්ෂා කිරීම සඳහා යම් නිත්‍ය නිළධාරියෙකු පත්කර ඔහු වෙත සේවකයින් දෙදෙනෙකු ලබාදී සතියකට වරක් හෝ මෙම කාණු පිරිසිදු කිරීමට කටයුතු කිරීමට යෙදවීම

සුදුසු බවට අදහසක් පවතිනවා.එය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

(ඒ.8.3) පාණදුර ගාලු පාරේ කොමර්ෂල් බැංකුව ඉදිරිපිට මාර්ගයේ ලොකු වලක් පවතින අතර වාහන මෙයට වැටුණ හොත් යම් අනතුරකට ලක්විය හැකියි.එමනිසා එම වල ,වසා දැමීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.8.4) කර්මාන්තපුරයේ කෝස්වේ ජේන්ට් ආයතනය ඉදිරිපිට හතරැස් ආකාරයට මාර්ගය ස්ථාන 02 කින් කපා දමා තිබෙනවා.සුමංගල විදුහලට දරුවන් රැගෙන යාම හා රැගෙන ඒමේදි මෙම මාර්ගය භාවිතා කරන බැවින් යම් අනතුරක් වීමට පෙර මෙයද වසා දැමීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.8.5) අයාලේ යන හරක් සම්බන්ධයෙන් අද දින සභා වාරයේදී සාකච්ඡා වූ අතර දිනක් උයන්කැලේ මාර්ගයේ ගමන් කරමින් සිටින විට දරුවෙක් උවමනාවෙන් කළ වැරද්දක් හේතුවෙන් හරක් එකපාරටම මාර්ගය වෙත පැණීමක් සිදුවුණා.එහිදී වේගයෙන් ගමන් කළානම් ඒ අවස්ථාවේ තමාද අනතුරට පත්වීමට ඉඩතිබූ බව පවසා සිටින ලදී.

(ඒ.8.6) පාණදුරේ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් ලෙස ඉතිහාසයේ ලොකුම ජනරැළිය පසුගිය දිනක පැවැත්වූවා.ඒ සඳහා සභාවේ නිළධාරීන් හා සේවක මහත්ම මහත්මීන් දැක්වූ සහයෝගයට ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

(ඒ.8.7) සභාවේ නිළධාරීන්ට හා සභික මහත්ම මහත්මීන් වෙනුවෙන් පැවැත්වූ වැඩසටහන සඳහා සහභාගී වීමට නොහැකි වූයේ පක්ෂයේ වැඩ කටයුතු පැවති බැවින් වන අතර ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් පියසේන ප්‍රනාන්දු මන්ත්‍රීතුමා එම වැඩසටහන් සඳහා සහභාගී වුණා.කෙසේ හෝ අප දේශපාලනය කරන්නේ රට මේවන පවතින තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහා වූ කාර්යයන් සඳහා වන බැවින් එම දේශපාලන කටයුතු වලට යොමු වීම පිළිබඳව අපද සතුටු වෙනවා යැයි පවසා සිටින ලදී.

(ඒ.8.8) මෙම වසරේ සභිකයින් සඳහා ලක්ෂ 10 බැගින් ප්‍රතිපාදන වෙන්කළද තමාගේ ප්‍රතිපාදන කිසිදු ව්‍යාපෘතියක් සඳහා මේවන තෙක් ලබාගත්තේ නැහැ.එබැවින් තමා විසින් ගලවැටිමෝදර මෝය පළල් කර පැතිබැම්ම ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජන කර ඇති අතර එම ලක්ෂ 10 ක මුදලින් හැකි පමණට හෝ එම ව්‍යාපෘතිය ඉටු කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.8.9) පාණදුරේ ගාලු පාර මැද ඇති විදුලි පහන් නැවත දැල්වෙන්නේ නැහැ.පෙර අවස්ථාවේදී නගර සභාවේ කුසුම්සිරි මහතා හා විදුලි අංශයේ සේවක මහතුන් මැදිහත් වී එම කාර්යය ඉටු කර දුන්නා.නැවතත් හැකියාවක් ඇත්නම් තැනින් තැන හෝ මෙම විදුලි පහන් දැල්වෙන තත්ත්වයට පත්කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.9) <u>ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය</u>

(ඒ.9.1) පැවති පුහුණු වැඩසටහන සංවිධානය කිරීමේ මුල් අවධියේදී මූල්‍යමය ගැටළුවක් මත අදාළ වැඩසටහන නතර කිරීමට අදහස් ඉදිරිපත් වුණා.ඒ අවස්ථාවේ නිළධාරීන් සිත්තැවුලටද පත්වුණා.කෙසේ හෝ ඒ අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත මහතා ඉදිරිපත් වෙලා එම වැඩසටහන සිදුකිරීමට ඔහුගේ පවුලේ රුදිගෝ පදනම පිහිටි ගොඩනැගිල්ල හා භූමිය ලබාදීමටත් වැඩසටහන අවසන් වෙන තෙක් ඒ සම්බන්ධ කටයුතු සොයා බැලීමටත් කටයුතු කළා.එමනිසා ඒ ලබාදුන් සහය සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතාට ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

(ඒ.9.2) 2022 ඔක්තෝබර් මස මහා සභා වාරයේ සංදේශ හා ලිපි අවස්ථාවේදී ජනජය මාවතේ ජගත් කුමාර මහතාගේ තාප්පය පිළිසකර කර දෙන ලෙස එතුමා විසින් ඉල්ලා සිටින ලද ලිපියක් ඉදිරිපත් කළා.මෙහිදී සිදුවී තිබෙන්නේ එතුමාගේ නිවස අසලින් යන කාණුව ,සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක සඳරුවන් මහතාගේ අධීක්ෂණය යටතේ සභා සේවකයින් විසින් පිරිසිදු කළ අතර එහි කාණු පස් හා වැලි දැමීමට තැනක් නොමැති බැවින් එතුමා විසින් එතුමාගේ තාප්පයෙන් කොටසක් කඩා එතුමාගේ ඉඩමට දැමීමට අවසර ලබාදී තිබෙනවා.මෙම තාප්පයේ තවත් කොටසක් එදිනම සභා සේවකයින් විසින් කඩා දා තියෙනවා,එතුමාගේ අවසරයකින් තොරව.එම අවස්ථාවේදී ඒ බව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට දැනුම් දී තිබූ අතර එහිදී මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා පොරොන්දු වී තිබෙනවා තාප්පය සාදා දෙන්නම් කියා.නමුදු පැවති සිමෙන්ති හිඟතාවය මත එය සකස් කිරීම කල්ගත වී තිබෙනවා.නමුදු 2022.10.10 වන දින එතුමාගේ වියදමින් තාප්පය සකසා ගෙන තිබෙනවා.එම සකස් කරන ලද තාප්පය,පැය කිහිපයකින් කවුරුන් හෝ පෙරළා දමා තිබෙනවා.ඒ අනුව ඇතිවූ කුහරයෙන් නගර සභා සීමාවේ වැසියන් නොයෙකුත් අක්‍රමිකතා හා තාප්පය උඩින් කසල යොමුකිරීමක් සිදුවන බව දන්වා සිටිනවා.එතුමා ඉල්ලා සිටින්නේ එතුමාගේ තාප්පය,සභාව විසින් සාදා දෙන ලෙසත් ප්‍රාදේශීය සභා සීමාවේ ඉඩමක් වන බැවින් නගර සභා සීමාවේ පිරිසට එම ඉඩමට කසල බැහැරනොකරන ලෙස අවවාද කරන ලෙසත්ය.

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

අදාළ ස්ථානයේ සියළු දෙනා කාණුව වැසීමට කටයුතු කර තිබෙනවා.එමෙන්ම මෙම ඉඩම ප්‍රාදේශීය සභා සීමාවේ තිබෙන්නේ.එමෙන්ම එම කාණුව ,සකස් කළ යුත්තේත් ප්‍රාදේශීය සභාව මඟින් බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙහිදී සිදුවී තිබෙන්නේ කාණුව පිරිසිදු කිරීමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා යම් පොරොන්දුවක් දී එම තාප්පය කඩා දැමීමයි.එම නිසා තාක්ෂණ නිළධාරීන් ගොස් එම ස්ථානය පරීක්ෂා කර තත්ත්වය දන්වා සිටින ලෙස පවසා සිටින ලදී.

(ඒ.9.3) පුස්තකාල කමිටුව නියෝජනය කරන සාමාජිකයෙකු වශයෙන් දෙසැම්බර් 12 වන සඳුදා දින උදෑසන 08.30 ට නගර සභාවේ සාහිත්‍ය උත්සවයේ පාණදුර නගර ශාලාවේ පැවැත්වෙන බැවින් ඒ සඳහා සහභාගී වන ලෙස ආරාධනා කරන බව පවසා සිටින ලදී.

(ඒ.10) <u>**ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා**</u>

(ඒ.10.1) සභාව විසින් ලක්ෂ 20 ගණනක පමණ මුදලක් වැය කර මේවන විට වැඩ අංගනයේ ඩීසල් ටැංකියක් භූගතව ස්ථාන ගත කර තිබෙනවා.නමුදු මෙම ටැංකියෙන් ඉන්ධන ලබාගැනීමට අවශ්‍ය පොම්පය මේවන තුරු ලබාගැනීමට නොහැකි වී තිබෙනවා.ටැංකිය සඳහා වියදම් කළ මුදල නාස්ති වීමට පෙර හැකි විගසින් මෙම පොම්පය මිලදී ගැනීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා</u>

මේ සම්බන්ධයෙන් මේවන විටත් කටයුතු කරගෙන යනු ලබනවා.මෙහිදී නව පොම්පයක් ලබාගැනීමට ලක්ෂ 20 ක් පමණ වැය වෙනවා.ඒවගේම තවත් පොම්ප වර්ගයක් පවතිනවා ඉන්ධන හල්වලින් ඉවත් කරන ලද පොම්ප.මේවා කැඩී ඇති පොම්ප නොවෙයි.එම පොම්පයක් ලක්ෂ 02 කට පමණ මුදලකට ලබාගත හැකියි.නමුදු එම පොම්පය සඳහා වගකීම් කාලයක් ලබාදීමක් සිදුවන්නේ නැහැ.

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

මා දන්නා තරමින් රාජ්‍ය ආයතන සඳහා භාවිතා කරන ලද උපකරණ මිලදී ගත නොහැකියි.එමනිසා සභාවේ දිගුකාලීන භාවිතය සඳහා ලක්ෂ 20 ක මුදලක් ගෙවා හෝ නව පොම්පයක් මිලදී ගැනීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

(ඒ.10.2) නගර ශාලාවේ ජනෙල් මේවන විට සකස් කර සවිකර තිබෙනවා.නමුදු මෙම ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටසෙහි බිත්ති පුපුරා තිබෙනවා.එමනිසා එම පිපිරීම් සකස් කර තීන්ත ගා පිළිසකර කළ යුතුයි.තවද ශාලාව ඉදිරිපිට ඇති ගස් හේතුවෙන් නගර ශාලාව නිසි පරිදි ජනතාවට දිස්නොවන බැවින් එම ගස්ද ඉවත්කර අලංකාර ගස් වවා එම ස්ථානය අලංකාර කිරීමටද කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

(ඒ.11) <u>**ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා**</u>

(ඒ.11.1) පාණදුරේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහතාගේ පිළිරුවක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු ඉඩම් කොටසක් ලබාදෙන ලෙස මීට පෙර සභා තීරණයක් ගෙන තිබෙනවා.මේවන විට එතුමාගේ සහෝදරයෙකු නැවතත් මේ සඳහා ඉල්ලීමක් කර ඇති අතර ඔවුන්ගේ පෞද්ගලික වියදමෙන් මෙම පිළිරුව සකස් කිරීමට කැමැත්තද පළ කරන අතර ඔවුන් ඉල්ලා සිටින්නේ ස්ථානයක් පමණයි. ශ්‍රී මහා විහාර පාරේ සිට කේතුමතී කාන්තා රෝහල පසුකර ජයතිලක මාවත ආරම්භ වන ස්ථානයේ මුල මේ සඳහා සුදුසු ස්ථානයක් ලෙස පෙනී යනවා.එමනිසා අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර අදාළ කාර්යය එම පවුලේ සාමාජිකයින්ට ඉටු කර ගැනීම සඳහා ස්ථානයක් කඩිනමින් ලබාදීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

(ඒ.11.2) ත්‍රීවීල් වල බලපත්‍ර ලබාදීම මේවන විටත් නිසි ආකාරව සිදුවන්නේ නැහැ.එමෙන්ම ත්‍රීවීල් කමිටුවෙන් ගන්නාවූ තීරණ නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වීමක් සිදුවන්නේත් නැහැ. ත්‍රීවීල් නැවතුම්පොළවල්වල ගාල් කළ හැකි රථ ගණන 2% කින් වැඩිකිරීමට කමිටුවෙන් තීරණය කලද එය ක්‍රියාත්මක කිරීමේදී ත්‍රීවීල් රථ ගාල්වල රියදුරන්ගේ තර්ජන වලට යටත් වීමට සිදු වී තිබෙනවා.සභාවක් වශයෙන් එසේ සිදුකළ යුතු නැහැ.සභාව යම් තීරණයක් ගත්තේ නම් ඒවා ක්‍රියාත්මක කිරීමට බියවිය නැති බව පවසා සිටින ලදී.

(ඒ.11.3) මාගේ ආදරණීය බිරිඳගේ හදිසි අභාවයෙන් පසු ,පසුගිය දින පැවති බණ හා දානමය පිංකමට සහභාගි වුණු ගරු සභික මහත්ම මහත්මීන්ටත් ,නිලධාරීන් ඇතුළු සියළුම සේවක මහත්ම මහත්මීන්ටත් ඔවුන්ගේ සහභාගී වීම සම්බන්ධයෙන් ගෞරවනීය ස්තුතිය පුදකරන බව පවසා සිටින ලදී.

2022.12.08 වන දින මහා සභා න්‍යාය පත්‍රයට අනුව නියමිත කරුණු එපමණක් වූයෙන් අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට තම ස්තුතිය පුද කරමින් 2022 දෙසැම්බර් මස 08 වන දින මහා සභාවේ වැඩ කටයුතු ප.ව. 02.15 නිමාවට පත් විය.

සභාපති,	ඇම්.ඩී. නන්දන ගුණතිලක සභාපති පාණදුර නගර සභාව	ලේකම්
නගර සභාව,		නගර සභාව,
පාණදුර.		පාණදුර
දිනය:		දිනය: 2022.12.20

ටී. මානෙල් සියඹලාගොඩ
ලේකම්
පාණදුර නගර සභාව